# ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2016


**ජාතික වැවිලි කළමනාකරණ ආයතනය**
**එම්. ඩී. එච්. ජයවර්ධන මාවත**
**අතුරුගිරිය**

දුරකථනය : 011 - 2770232
ෆැක්ස් : 011 - 2798775
විද්‍යුත් තැපෑල : nipm@sltnet.lk/nipd@sltnet.lk
වෙබ් : **www.nipm.gov.lk**

| පටුන | පිටු අංකය |
|---|---|


| | |
|---|---|
| දැක්ම හා මෙහෙවර ප්‍රකාශය | 3 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 4 |
| අධ්‍යක්ෂක /ප්‍රධාන විධායක නිළධාරීතුමාගේ සමාලෝචනය | 5-6 |
| ආයතනය ස්ථාපිත කිරීම හා අරමුණු | 7-8 |
| පාලක මණ්ඩලයේ වාර්තාව | 8-9 |
| පාලක මණ්ඩලයේ සංයුතිය | 9 |
| විගණන හා කළමනාකරණ කමිටුවේ වාර්තාව | 9-10 |
| ආයතනයේ කාර්ය මණ්ඩලය | 11-13 |
| සංවිධාන සටහන | 14 |
| පරිපාලන සමාලෝචනය | 15 |
| ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරකම් | 15-18 |
| **පුහුණු වැඩසටහන් වල ප්‍රගති සමාලෝචනය** | 18-26 |
| ආයතනයේ වෘත්තීය සාමාජිකත්වය | 26 |
| ප්‍රකාශන | 27 |
| ආයතනය සපයන පහසුකම් | 27-28 |
| මූල්‍ය සමාලෝචනය | 29 |
| ආයතනය මුහුණ දුන් සංරෝධක | 32 |
| අනාගත සැලසුම් | 33 |
| සමාප්තිය | 33 |

# දැක්ම

වැව්ලි කළමනාකරණය පිලිබඳ පුහුණුව හා උපදෙස් සැපයීම සහ සමීක්ෂණ පැවැත්වීමේ විශිෂ්ඨ ආයතනය බවට පත්වීම.

# මෙහෙවර

ගුණාත්මක පුහුණුව තුලින් වැව්ලි කර්මාන්තයේ සියළුම මානව වත්කම්හි වෘත්තිය නිපුණතාවය පරිපූර්ණත්වය දෙසට ඉහළ නැංවීම.

# <u>සභාපතිතුමාගේ පණිවිඩය</u>



2016 වාර්ෂික වාර්තාව සඳහා පණිවිඩයක් සටහන් කිරීම, මට ඉමහත් සතුටකි. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මගින් සිදු කරනු ලබන අධ්‍යාපනික ක්‍රියාකාරකම් එහි සුවිශේෂී ජාතික පැතිකඩක් පවත්වාගෙන යමින් සිටී. මෙය අප විසින් පවත්වාගෙන යනු ලබන වැඩසටහන්, ඒ සඳහා ලැබෙන ප්‍රතිචාරයන් හා පෞද්ගලික පාර්ශවයන් ආකර්ෂණය කර ගැනීමේදී හා අපගේ අධ්‍යාපනික කාර්ය මණ්ඩලය තුළින් ලබා ගන්නා ලද දායකත්වය මගින් පිළිඹිබු කෙරේ. ජාතික හා ගෝලීය වශයෙන් ශක්තිමත් අධ්‍යපනික තරගකරුවකු වීම සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් ජාතික හා ගෝලීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ වර්ධනය වන අභියෝගයක් අපේක්ෂා කළ යුතු අතර, ඒ සඳහා පර්යේෂණ ධාරිතාව, ඉගැන්වීමේ ක්‍රමවේද හා ආයතනයේ කීර්තිනාමය වැඩි දියුණු කර ගත යුතුය. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් අධ්‍යයන කාර්ය මණ්ඩලය හා අනධ්‍යන කාර්ය මණ්ඩලයේ හැකියාවන් වැඩිදියුණු කිරිම සහ ආකල්ප සංවර්ධනයට අදාළව උපාය මාර්ගික සහය ලබා ගැනීම සඳහා වැඩි වශයෙන් ආයෝජනය කරනු ලබයි

ආයතනය විසින් පවත්වනු ලබන විවිධ වැඩසටහන් සඳහා සහභාගීවන්නන් 11000 කට අධික

සංඛ්‍යාවක් ලඟාකර ගැනීම යන ඉලක්කය සපුරා ගැනීමෙහි ලා 2016 වසරේ සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇත. ආයතනයේ අධ්‍යාපනික හා ඉගැන්වීම් ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ද අත්‍යවශ්‍ය කරුණක් වේ.

කර්මාන්ත අංශයේ තිරසරභාවය හා නිපුණතාවය වැඩි දියුණු කිරීම ආයතනය විසින් පවත්වනු ලබන විවිධ වැඩසටහන් සඳහා සහභාගීවන්නන් 11000 කට අධික සංඛ්‍යාවක් ලඟාකර ගැනීම යන ඉලක්කය සපුරා ගැනීමෙහි ලා 2016 වසරේ සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන ඇත. ආයතනයේ අධ්‍යාපනික හා ඉගැන්වීම් ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ද අත්‍යවශ්‍ය කරුණක් වේ. කර්මාන්ත අංශයේ තිරසරභාවය හා නිපුණතාවය වැඩි දියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ද අත්‍යවශ්‍ය කරුණක් වේ. ඒ සඳහා උපාධි පාඨමාලා 03 ක් සංවර්ධනය කරන අතරම කාර්මික තිරසාරත්වය පිළිබඳ මානව සම්පත් හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සැලසුම් කරයි.

අවසානයේදී, මෙම ආයතනයේ සංවර්ධනය උදෙසා මහත් සහයෝගයක් ලබා දුන් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාටද, අමාත්‍යාංශ ලේකම්තුමාට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයටද මාගේ ස්තූතිය පිරිනමමි. එමෙන්ම ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂතුමාට ද එම ආයතනයේ සියලුම සාමාජිකයන්ට ද ප්‍රගතිශීලි මූල්‍ය වසරක් වෙනුවෙන් කරනු ලැබූ කැපවීම් සඳහා ස්තූතිය පිරිනමමි.

**දීප්ති අශෝක අබේවික්‍රම**

**සභාපති**

**31.07.2017**

# අධ්‍යක්ෂතුමාගේ පණිවිඩය



## අධ්‍යක්ෂ සමාලෝචනය

ජාතික වැවිලි කළමනාකරණ ආයතනයෙහි කාර්යභාරය පසුගිය වසර කිහිපය පුරාවට අතිශයින් සංකීර්ණ වී ඇති අතර අති විශාල තරඟකාරීත්වයක් හා අභියෝගයන් සහිත යුගයක, ජාතික වැවිලි අධ්‍යාපන ආයතනයක් වශයෙන් අපගේ කාර්යභාරය අප විසින් මනා කොට වටහාගෙන ඇති අතර  වැවිලි ක්ෂේත්‍රයට ඍජුව හා වක්‍රව සම්බන්ධ වන වැවිලිකරුවන්, කුඩා වතු හිමියන් හා වෘත්තිකයන්ගේ රාජකාරීන් කාර්යක්ෂමව ඉටු කිරීමෙහි ජාතික වෙනස්කම් හා අන්තර්ජාතික ප්‍රවණතාවන්ට අනුකූලව නිපුණතා හා දැනුම වර්ධනය කිරීමට සියලු පියවරයන් ගෙන ඇත.

## වැවිලි ක්ෂේත්‍රයේ තිරසාරභාවය සඳහා ආයතනික දායකත්වය

වැවිලි ක්ෂේත්‍රයේ ඉදිරි පිම්මක් සඳහා හැකියාව ඇති වැවිලිකරුවන්ගෙන් යුත් ශක්තිමත් වැඩපිළිවෙලක් දියත් කිරීම සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම්, කුඩා වතු හිමියන්, පර්යේෂණ ආයතන, රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ රට වටා සිටින අනෙකුත් පාර්ශව සමඟ අප දිගටම කටයුතු කරන්නෙමු. ඒ අනුව අප සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සිසුන් 11337 කට අධික ප්‍රමාණයක් සඳහා ප්‍රතිලාභ දෙමින් වැඩසටහන් 180 කට අධික ප්‍රමාණයක් මෙම මුදල් වර්ෂය තුළ ක්‍රියාත්මක කර ඇත.

2016 වර්ෂයේ  ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අද්විතීය ක්‍රියාකාරකම් අතර, වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ සෑම දිස්ත්‍රික්කයකම 580 කට අධික පිරිසක් සහභාගී වූ අධ්‍යාපන හා වෘත්තීය වැඩසටහන් 22 ක් පැවැත්වීම සඳහන් කළ හැකිය. 2016 වසරේ කුඩා වතු හිමියන්ගේ ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන් 126 ක් පැවැත්වීම සඳහා මිලියන 6.30 ක ප්‍රමාණයක් වෙන් කොට ඇති අතර ජාතික වැවිලි කළමනාකරණ ආයතනය විසින් වැඩසටහන් 160 ක් පැවැත්වීම තුළින් ප්‍රගතියක් වාර්තා කර ඇත. වැවිලි ක්ෂේත්‍රය ගෝලීය හා ජාතික අස්ථාවරත්වයක තිබියදී ද ජාතික වැවිලි කළමනාකරණ ආයතනය පුහුණු වැඩසටහන් සඳහා රු.මිලි. 6.553 ක් වෙන් කර ඇති අතර එය ආයතනය විසින් පවත්වනු ලැබූ සියලු පුහුණු ක්‍රියාකරකම් වලින් රු. 12.787 ක මුළු ආදායමක් ලෙස වාර්තා වී ඇත.

## කර්මාන්තය අර්බුදකාරී තත්වයක පැවතීම

වැවිලි අංශයේ ආර්ථිකය තුළ මන්දගාමීත්වයක් ඇති වීම කෙරෙහි ප්‍රධාන වැවිලි භාණ්ඩ අපනයන වෙළඳපොළ තුළ ගෝලීය වශයෙන් පවත්නා ආර්ථික හා දේශපාලනික වාතාවරණයන්, අහිතකර කාලගුණික බලපෑම් හා කෘෂිකාර්මික අංශයේ අස්ථාවරත්වය, බලපානු ඇත. දිවයින පුරා වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට අදාල මානව සම්පත් සංවර්ධනය හා වැඩි දියුණු කිරීම සඳහා ආයෝජකයන් හඳුනා ගැනීමට සාධක වූ ගෘහස්ථ කෘෂි ආර්ථිකය තුළ අස්ථාවරත්වයක් ඇති වීම සඳහා  වැටුප් ඉහළ යාම, සමාජ ආර්ථික අර්බුද වලින් ඇති වන කම්කරු අවිවේකය, අයහපත් කාලගුණ තත්වයන්ද හේතු වී ඇත.

## ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සහ එහි ආයතනික ජාලය

දිවයින පුරා පිහිටි සියලුම පර්යේෂණ ආයතන, පෞද්ගලික හා රාජ්‍ය ආයතන සමඟ නවීන තාක්ෂණික දැනුම සහ වැවිලිකරුවන් සඳහා අදාල වන  කුසලතා ව්‍යාප්ත කිරීම සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සතුව ශක්තිමත් හා ඵලදායි ජාලයක් ඇත. මෙම ඒකක මඟින් තක්සේරු කිරීම හා තාක්ෂණික වැඩි දියුණු කිරීම් සිදු කිරීම, ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, ප්‍රාදේශීය වැවිලි සමාගම් හඳුනා ගැනීමේ ක්ෂේත්‍ර චාරිකා, දැනුවත් කිරීමේ වැඩසටහන්, ප්‍රදර්ශන, කණ්ඩායම් සාකච්ඡා, ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම් සිදු කරනු ලබයි. කාර්මික සංවර්ධනය පිළිබඳ වැවිලි ප්‍රජාව දැනුවත් කිරීම සඳහා එකී සඳහන් කළ කරුණු අතිශය වැදගත් සාධක වේ.

**පුරෝකථනය කර ඇති සැලසුම්**

2020 වන විට ක්ෂේත්‍රයට අනුබද්ධිත මානව සම්පතෙහි නිපුණතා හා ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා වැවිලි කර්මාන්තය සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සංවර්ධනය කිරීම සඳහා උපාධි පාඨමාලා 03 ක් ආරම්භ කිරීමට ජාතික වැවිලි කළමනාකරණ ආයතනය සැලසුම් කරනු ලබයි. පර්යේෂණ හා සංවර්ධනය කර්මාන්තයේ තිරසාරත්වය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර අපගේ මීළඟ මධ්‍යකාලීන සැලැස්ම තුළ අප ආයතනය උපාධි පිරිනැමීමේ ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපනය කිරීම සඳහා ප්‍රමුඛතාවක් ලබා දීම තුළින් මෙය යතාර්ථයක් බවට පත් කර ඇත.

2017-2020 උපායමාර්ගික අරමුණු මගින් ආයතනයක් වශයෙන් අප ඊළඟ වසර 04 තුළ අත්පත් කර ගත යුතු දෑ පිළිබඳ දළ විශ්ලේෂණයක් ඉදිරිපත් කර ඇත.

මේවා නම් :-

උපායමාර්ගික අරමුණු 01 :- ක්ෂේත්‍රය සඳහා ගුණාත්මක සේවාවක් සැපයීමට අප ආයතනය ශක්තිමත් කිරීම හා ආයතනයේ මානව සම්පත සංවර්ධනය කිරීම හා පුහුණු අංශය ශක්තිමත් කිරීම.

උපායමාර්ගික අරමුණු 02 :- අලෙවිකරණය හා ප්‍රවර්ධනය ශක්තිමත් කිරීම තුළින් අධ්‍යාපනික විසඳුම් සමඟ පුළුල් කීර්තිනාමයක් අත්පත් කර ගැනීම.

උපායමාර්ගික අරමුණු 03 :- යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා මනා තත්ව කළමනාකරණ පද්ධතියක් සහිත ආකර්ශණීය පරිසරයක් ඇති කිරීම.

අප ආයතනික වශයෙන් සංවර්ධනය වෙමින් පවතින බැවින් නව මාර්ගයන්, නව්‍යකරණය හා දායකත්වය වැඩි දියුණු කිරීම, කාර්යයන් සිදු කිරීම සඳහා පුද්ගලයන් බල ගන්වන, අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙන, නවෝත්පාදනයන් සිදු කරන, ආයතනය දක්වන දායකත්වය පිළිබඳ ස්වයං ඇගයීමක් සිදු කරනු ලබන උද්‍යෝගීමත් පරිසරයක් පවත්වාගෙන යාමට අවශ්‍ය වේ. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන්ගේ හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුග්‍රහය හා මඟ පෙන්වීම යටතේ දියුණුව කරා ළඟා වීමට අප ආයතනයට හැකියාවක් ලැබී ඇත. එමෙන්ම මෙම වසර සාර්ථක වසරක් බවට පත් කර ගැනීමට උපරිම සහයෝගයක් ලබා දුන් ආයතනයේ සභාපතිතුමාටත් ජාතික වැවිලි කළමනාකරණ ආයතන පවුලේ සාමාජිකයන්ටත් මාගේ විශේෂ ස්තූතිය පිරිනමමි.



**ආචාර්ය ප්‍රසාද් ධර්මසේන**

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරි**

**31.07.2017**

# ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

# 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

# පරිපාලන වාර්තාව

**ආයතනය ස්ථාපිත කිරීම හා අරමුණු**



ජාතික වැවිලි කළමනාකරණ ආයතනය 1979 ජූලි මාසයේ දී අංක 45 දරණ පාර්ලිමේන්තු පනත මඟින් ස්ථාපනය කරන ලද ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, වඩාත් ඵලදායී හා ශක්තිමත් රාජ්‍ය ව්‍යස්ථාපිත ආයතනයක් ඇති කිරීම උදෙසා 1981 අංක 76, 1976 අංක 05 සහ 2003 අංක 38 දරණ පනත් මඟින් සංශෝධනයට භාවිතා කර ඇත. ආයතනයේ ලියාපදිංචි කාර්යාලය එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය යන ලිපිනයේ ස්ථාපිතව පවත්වා ගෙන යනු ලැබේ.

මෙම පනත් වලට අනුව, පුහුණු වැඩසටහන් / අධ්‍යයන පාඨමාලා සාර්ථකව නිම කරන අයට සහතික පත්‍ර නිකුත් කිරීමට සහ වතු විධායක නිලධාරීන් සඳහා වෘත්තීය සාමාජිකත්වය ප්‍රධාන කාණ්ඩ 03 ක් යටතේ පිරිනැමීම සඳහා රජයේ එකම ආයතනය ලෙස ජාතික වැවිලි කළමනාකරණ ආයතනය බල ගන්වා ඇත. කුඩා වතු හිමියන් ද ඇතුළුව වැවිලි ක්ෂේත්‍රයේ රැකියා නියුක්තිකයන්ගේ වෘත්තීය හැකියාවන් ඉහල නිපුණතාවයෙන් යුතුව පවත්වා ගෙන යාම මේ මඟින් සහතික වේ. මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධාකාරයේ සම්මන්ත්‍රණ, වැඩමුළු, විභාග පැවැත්වීම සහ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා පර්යේෂණ හා උපදේශන සේවා සැපයීම සිදු කරයි. එමෙන්ම විදේශ සිසුන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමේ හැකියාව ආයතනය සතුව ඇත.

## 01. පරමාර්ථ

අ) වැවිලි සේවයෙහි නියුක්ත සියලු වර්ග වලට අයත් සේවා නියුක්තයන්ට ආයතනය විසින්ම හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි ඇති වෙනත් ආයතන සම්බන්ධව වැවිලි කළමනාකරණයට අදාල පුහුණු වීමේ පහසුකම් සහ පුහුණු වීමේ වැඩ සටහන් සැපයීම.

ආ) සේවයෙහි යෙදී සිටින සේවා නියුක්තයන්ට වැවිලි කළමනාකරණය පිළිබඳ සංස්කරණ සම්මේලන සහ තත්වානුකූලකරණ පාඨමාලා සංවිධානය කිරීම

ඇ) රාජ්‍ය අංශයෙහි මෙන් ම පෞද්ගලික අංශයෙහි වැවිලි සේවයේ නියුතු සේවක පිරිස් සඳහා වැවිලි කළමනාකරණය පිළිබඳ පුහුණුව සැලසීම

ඈ) තේ පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය , පොල් පර්යේෂණ ආයතනය සහ එබඳු වෙනත් ආයතනයන් හා සම්බන්ධව ඩිප්ලෝමා පාඨමාලා සංවිධානය කිරීම සහ යෝග්‍ය අවස්ථාවල දී ඩිප්ලෝමා ප්‍රදානය කිරීම

ඉ) වැවිලි කළමනාකරණය හා සංවර්ධනය සම්බන්ධ වූ සම්මන්ත්‍රණ හා කාර්ය සැසි සංවිධානය කිරීම හා පැවැත්වීම සහ සගරා සහ කලාප පළ කිරීම.

ඊ) වෙනත් සමාන ආයතන වලින් දැනටමත් විධි විධාන සලස්වා නොමැති, වැවිලි කළමනාකරණය සහ කම්කරු සම්බන්ධතා ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම.

උ) වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් අවශ්‍ය දක්ෂතාවය ඇති තැනැත්තන්ට වැවිලි කර්මාන්තයේ මිනිස් බල අවශ්‍යතාවයන් ගැන සැලකිලිමත්ව වැවිලි කළමනාකරණය සම්බන්ධයෙන් පුහුණුව ලබා දීම.

එ) වැවිලි කර්මාන්තය සම්බන්ධයෙන් යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකට, රාජ්‍ය සංස්ථාවකට හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර යම් වෙනත් ආයතනයකට කළමනාකාරීත්ව, තාක්ෂණික සහ පරිපාලන උපදෙස් සහ සේවා සැපයීම.

## පාලක මණ්ඩලයේ වාර්තාව

සමාලෝචිත වර්ෂයේ දී ආයතනයේ පාලක මණ්ඩලයේ රැස්වීම් 12 ක් අතුරුගිරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතන පරිශ්‍රයේ දී පවත්වන ලදී. මෙම පාලක මණ්ඩල රැස්වීම් අතරතුර පහත සඳහන් ප්‍රධාන කරුණු හා ක්‍රියාකාරකම් සමාලෝචනයට භාජනය කර ඒ සඳහා සුදුසු පරිදි අනුමැතීන් ලබා දී ඇත.

- ආයතනයේ ක්‍රියාකාරකම් ඉහලම අනුකූලතාවයකින් යුතුව ඉටු කල බවට සහතික කිරීම.
- පුහුණු අංශයේ සියලුම මෙහෙයුම් හා ක්‍රියාකාරකම් හි පාරදෘශ්‍යභාවය හෙළිදරව් වන අකාරයට කටයුතු කල බව සහතික කිරීම.
- ආයතනයේ සියළුම පාර්ශවකරුවන් වෙත අපේක්ෂිත ප්‍රතිපල ලබා දීම සඳහා ආයතන සතු සම්පත් ඉහල ඵලදායීතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව මෙහෙයවීම.
- ආයතනයේ මධ්‍ය හා දිගු කාලීන උපාය මාර්ග, වාර්ෂික අයවැය, ක්‍රියාකාරී සැලසුම, සැලකිය යුතු මූල්‍ය මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම හා අනුමැතිය ලබාදීම.

1979 අංක 45 දරණ ජාතික වැවිලි කළමනාකරණ ආයතන පනතේ 06 වන වගන්තිය සහ 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 දරණ සංශෝධිත පනත් වල විධි විධාන වලට අනුව 2016 වර්ෂයේ පාලක මණ්ඩලය පහත සඳහන් පුද්ගලයින්ගෙන් සමන්විත විය.

| නම | ස්වරූපය | නම | ස්වරූපය |
|---|---|---|---|
| දීප්ති අබේවික්‍රම මහතා<br>සභාපති<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | සභාපති | මලීන් ගුණතිලක මහතා<br>ලේකම්<br>ලංකා වැවිලි කරුවන්ගේ සංගමය | සාමාජික |
| ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා<br>අධ්‍යක්ෂ / ප්‍රධන විධායක නිලධාරී<br>ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | සාමාජික | ඉන්දික ප්‍රේමරත්න මහතා<br>අධ්‍යක්ෂ<br>මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය | සාමාජික |
| අචාර්ය ඩබ්. එම්. පී. සෙනෙවිරත්න මහතා<br>අධ්‍යක්ෂ<br>රබර් පර්යේෂණ ආයතනය | සාමාජික | ඒ. ආර්. ටයිටස් සුනිල් සිල්වා මහතා<br>සභාපති<br>තුරුසවිය අරමුදල | සාමාජික |
| ආචාර්ය අයි. එස්. බී. අබේසිංහ මහතා<br>අධ්‍යක්ෂ<br>තේ පර්යේෂණ ආයතනය | සාමාජික | එම්. එම්. ඩී. තිලකරත්න මහතා<br>නියෝජිත<br>වෘත්තීය සමිති | සාමාජික |
| ආචාර්ය එල්. සී.පී. ප්‍රනාන්දු මිය<br>අධ්‍යක්ෂ<br>පොල් පර්යේෂණ ආයතනය | සාමාජික | එන්. එම්. ආර්. ජයතිලක මහතා<br>නියෝජිත<br>චන්දන ජයසේකර මහතා | සාමාජික |
| කේ. එන්. කුමාරි සෝමරත්න මෙනෙවිය<br>අතිරේක ලේකම්<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජික | නියෝජිත<br>ලංකා වැවිලි කරුවන්ගේ සංගමය | සාමාජික |
| අර්ජුන් දැරණියගල මහතා<br>නියෝජිත<br>පොල් වැවිලි කරුවන්ගේ සංගමය | සාමාජික | | |

- පොල් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂව සිටි ආචාර්ය ජයන්ත ගුණතිලක මහතා සේවයෙන් විශ්‍රාම ගැනීම නිසා සාමාජිකත්වයෙන් ඉවත් විය.

- ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂව සිටි ආචාර්ය නිශ්ශංක ඉද්දගොඩ මහතා සේවයෙන් විශ්‍රාම ගැනීම නිසා සාමාජිකත්වයෙන් ඉවත් විය.

## විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

ආයතනයේ විගණන හා කළමනාකරණ කමිටුව මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයට අනුකූලව පිහිටුවා ඇති අතර, පහත සඳහන් කරුණු විමර්ෂණය සඳහා එම කමිටුව වෙත නිසි අධිකාරී බලය ආයතනයේ පාලක මණ්ඩලය මගින් පිරිනමා ඇත.

- ආයතනයේ මූල්‍ය වාර්තා
- අභ්‍යන්තර පාලනය සහතික කිරීම.
- විගණන විමසුම් හා විගණන වාර්තා වලට අදාල කරුණු හා ආයතනය විසින් සකස් කරන ලද පිළිතුරු නිර්දේශ කිරීම.
- ප්‍රාග්ධන භාවිතය, පුනරාවර්තන වියදම් සහ ප්‍රසම්පාදන කමිටු තීරණ සමාලෝචනය කිරීම.
- අයවැය ඇස්තමේන්තු සහ සත්‍ය කාර්ය සාධනයේ සාර්ථකත්වය.

- අතිකාල දීමනා, ඉන්ධන භාවිතය, දුරකථන ගාස්තු සහ විදුලිය වියදම් සසදා බැලීම.
- පුහුණු කිරීමේ වැඩසටහන් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් වලට අදාළ ආදායම හා වියදම්.
- ආයතනයේ අනෙකුත් මූල්‍ය ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම.

2016 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇති අතර, එම රැස්වීම් ජනවාරි 13, මාර්තු 14, ජුනි 10, සහ ජුලි 25 යන දිනයන්හිදී පවත්වා ඇත.

## අභ්‍යන්තර විගණනය

ආයතනය සඳහා අභ්‍යන්තර විගණක නිලධාරියෙකු බඳවා ගැනීමේ කටයුතු ප්‍රමාද වී ඇති හෙයින් වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලැබේ.

## විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය

| නම | ස්වරූපය | නම | ස්වරූපය |
|---|---|---|---|
| ඉන්දික ප්‍රේමරත්න මහතා<br>අධ්‍යක්ෂ<br>විදේශ සම්පත් දෙපාර්තමේන්තුව<br>මුදල් හා සැලසුම් අමාත්‍යාංශය | සභාපති | ඩබ්. ඒ. ඩී. ඩී. එම්. ප්‍රියන්ත මහතා<br>අභ්‍යන්තර විගණක<br>වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශය | නිරීක්ෂණ සාමාජික |
| ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා<br>අධ්‍යක්ෂ / ප්‍රධන විධායක නිලධාරි<br>ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | සාමාජික | එල්. ඩී. ජේ. ප්‍රියන්ත මහතා<br>ගණකාධිකාරී<br>ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | ආයතනයේ නියෝජිත |
| කේ. එන්.කුමාරි සෝමරත්න මෙනෙවිය<br>අතිරේක ලේකම්<br>වැව්ලි කර්මාන්ත අමාත්‍යාංශය | සාමාජිකා | නිශාමිණි ඉලංගන්තිලක මිය<br>පුහුණු අංශ ප්‍රධානී<br>ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය | ආයතනයේ නියෝජිත |
| ආචාර්ය එල්. සී. පී. ප්‍රනාන්දු මිය<br>අධ්‍යක්ෂ<br>පොල් පර්යේෂණ ආයතනය | සාමාජිකා | සී. ඩී. මාගින ආරච්චි මිය<br>සහකාර අධ්‍යක්ෂිකා (පාලන) | ලේකම් විගණන හා කළමනාකරණ කමිටුව |

විගණන හා කළමනාකරණ කමිටුව ඉහත සඳහන් ක්‍රියාකාරී සහ ක්‍රියාකාරී නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. මුදල් හා සැලසුම් අමාත්‍යාංශයේ නියෝජිත ඉන්දික ප්‍රේමරත්න මහතා සභාපතීත්වය හොබවන ලදී.

- පොල් පර්යේෂණායතනයේ අධ්‍යක්ෂව සිටි ආචාර්ය ජයන්ත ගුණතිලක මහතා සේවයෙන් විශ්‍රාම ගැනීම නිසා සාමාජිකත්වයෙන් ඉවත් විය.
- ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ අධ්‍යක්ෂව සිටි ආචාර්ය නිශ්ශංක ඉද්දගොඩ මහතා සේවයෙන් විශ්‍රාම ගැනීම නිසා සාමාජිකත්වයෙන් ඉවත් විය.

## ආයතනීය කාර්යය මණ්ඩලය

අධ්‍යක්ෂ, ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරිවරයා වන අතර, ඔහු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ. 2016 වර්ෂය අවසාන වන විට ස්ථිර කාර්ය මණ්ඩලය 46 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය ප්‍රධාන ශ්‍රිතයන් තුනකින් සමන්විත වන අතර, එවා නම් පුහුණු අංශය, පරිපාලන අංශය හා ගිණුම් අංශය වේ.

## සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී

ආයතනයේ බලතල හා වගකීම් පැහැදිලි ලෙස සභාපති හා ප්‍රධාන විධායක නිලධාරිවරයා අතර බෙදී ගොස් ඇති අතර, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී දෙදෙනාම විධායක අධ්‍යක්ෂකවරුන් වන අතර ඔවුන් වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබේ.

සභාපති හා ප්‍රධාන විධායක අධ්‍යක්ෂ අතර පැහැදිලිව වෙනස් වූ වගකීම් හා බල අධිකාරීන් ඇත.

| | | |
|---|---|---|
| දීප්ති අබේවික්‍රම මහතා | - | සභාපති |
| ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා | - | අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී |

ආයතනයේ අධ්‍යක්ෂ ලෙස කටයුතු කල ආචාර්ය නිශ්ශංක ඉද්දගොඩ මහතා 2016 සැප්තැම්බර් මාසයේදී සේවයෙන් විශ්‍රාම ගන්නා ලදි.

## කළමනාකරණ සේවක මණ්ඩලය

මධ්‍යම කළමනාකරණ ශ්‍රේණිය නියෝජනය කරන ප්‍රධාන සේවක මණ්ඩලය සහ ඔවුන්ගේ තනතුරු පහත සඳහන් කර ඇත.

| | |
|---|---|
| එස්. එන්. ඉලංගන්තිලක මිය | - පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික) , පුහුණු අංශ ප්‍රධානී |
| එල්. ඩී. ජේ ප්‍රියන්ත මහතා | - ගණකාධිකාරී, මූල්‍ය අංශ ප්‍රධානී |
| සී. ඩී. මාගින ආරච්චි මෙනෙවිය | - සහකාර අධ්‍යක්ෂිකා (පාලන), පරිපාලන අංශ ප්‍රධානි |
| පී. එච්. ජයතිලක මහතා | - පුහුණු කිරීමේ විශේෂඥ (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ) පුහුණු අංශය |
| ආර්. එන් ලොකුහෙට්ටි මිය | - පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණ), පුහුණු අංශය |

## අනෙකුත් විධායක ශ්‍රේණියේ නිලධාරී මණ්ඩලය

| | |
|---|---|
| චමීර පතිනායක මහතා | - පුහුණු කිරීමේ නිලධාරී (කෘෂි ආර්ථික) |
| එම්. එල්. ආර්. ජයන්ත මහතා | - පරිපාලන නිලධාරී |
| එන්. ඩී. එස්. බී. තෙන්නකෝන් මහතා | - නේවාසිකාගාර කළමනාකරු - අතුරුගිරිය |
| කේ. පී. නේපාල මහතා | - මාණ්ඩලික සහකාර (පුහුණු) |



දීප්ති අබේවික්‍රම මහතා

සභාපති



ආචාර්ය ප්‍රසාද් ධර්මසේන මහතා

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි



එස්.එන්.ඉලංගන්තිලක මිය

පුහුණු කිරීමේ විශේෂඥ

(කෘෂි ආර්ථික )



එල්.ඩී.ජේ ප්‍රියන්ත මහතා

ගණකාධිකාරි



මාගින ආරච්චි මෙනෙවිය
සහකාර අධ්‍යක්ෂිකා (පාලන)



පී.එච්.ජයතිලක මහතා
පුහුණු කිරීමේ විශේෂඥ
(ගිණුම් හා මුල්‍ය කළමනාකරණ)



ආර්. එන් ලොකුහෙට්ටි මිය
පුහුණු කිරීමේ විශේෂඥ
(කළමනාකරණ)



එන්.ඩී.එස්.බී.තෙන්නකෝන් මහතා
නේවාසිකාගාර කළමනාකරු



චමීර පතිනායක මහතා

පුහුණු කිරීමේ නිලධාරි
(කෘෂි ආර්ථික)



එම්. එල්. ආර්. ජයන්ත මහතා

පරිපාලන නිලධාරි



කේ. පී. නේපාල මහතා

මාණ්ඩලික සහකාර (පුහුණු)

## 2016.12.31 දිනට කාර්ය මණ්ඩලය

### පුහුණු කිරීමේ අංශය (මුළු කාර්ය මණ්ඩලය 14)

| | |
|---|---|
| පුහුණු කිරීමේ විශේෂඥ (කෘෂි ආර්ථික) | 1 |
| පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණ) | 1 |
| පුහුණු කිරීමේ විශේෂඥ (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ) | 1 |
| පුහුණු කිරීමේ නිලධාරී (කෘෂි ආර්ථික) | 1 |
| මාණ්ඩලික සහකාර (පුහුණු) | 1 |
| කළමනාකරණ සහකාර | 7 |
| කාර්යාල කාර්ය සහායක | 2 |

### පරිපාලන අංශය  (මුළු කාර්ය මණ්ඩලය 24)

| | |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ (පාලන) | 1 |
| පරිපාලන නිලධාරි | 1 |
| නේවාසික කළමනාකරු | 1 |
| කළමනාකරණ සහකාර | 5 |
| රියදුරු | 6 |
| උද්‍යාන සහායක | 3 |
| කාර්යාල කාර්ය සහායක | 3 |
| නේවාසිකාගාර සහායක | 3 |
| සනීපාරක්ෂක කම්කරු | 1 |

### මූල්‍ය අංශය (මුළු කාර්ය මණ්ඩලය 08)

| | |
|---|---|
| ගණකාධිකාරී | 1 |
| කළමනාකරණ සහකාර | 6 |
| කාර්යාල කාර්ය සහායක | 1 |

සංවිධාන ව්‍යුහය පහත සඳහන් වේ.


සභාපති සහ පාලක මණ්ඩලය
අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම
පුහුණු අංශය
පාලන අංශය
මූල්‍ය අංශය
අභ්‍යන්තර විගණන
කෘෂි විද්‍යා
කළමනාකරණ
කළමනාකරණ මට්ටම
පුහුණු කිරීමේ විශේෂඥ කෘෂි ආර්ථික)
පුහුණු කිරීමේ විශේෂඥ (කළමනාකරණ)
පුහුණු කිරීමේ විශේෂඥ (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ)
සහකාර අධ්‍යක්ෂ (පාලන)
ගණකාධිකාරී
අභ්‍යන්තර විගණක
කණිෂ්ඨ කළමනාකරු
පුහුණු කිරීමේ නිළධාරී (කෘෂි ආර්ථික)
වැඩසටහන් නිළධාරී (විභාග)
පුහුණු කිරීමේ නිළධාරී (කළමනාකරණ)
පුහුණු කිරීමේ නිළධාරී (ගිණුම් හා මූල්‍ය කළමනාකරණ
පරිපාලන නිළධාරී
නේවාසිකාගාර කළමනාකරු -2
ප්‍රසම්පාදන සහකාර
ගිණුම් සහකාර
ආශ්‍රිත නිළධාරී
මාණ්ඩලික සහකාර (පුහුණු)
පුස්තකාලයාධිපති
කළමනාකරණ සහකාර 5
කළමනාකරණ සහකාර - 06
කළමනාකරණ සහකාර (තාක්ෂණික/තාක්ෂණික නොවන
ශ්‍රව්‍ය දෘශ්‍ය සහකාර
කළමනාකරණ සහකාර - 5
රියදුරු (7)
කාර්යාල කාර්ය සහායක (2)
උද්‍යාන සහායක - 03
මුද්‍රණ සහායක
සනීපාරක්ෂක කම්කරු
නේවාසිකාගාර සහායක - 03
කාර්යාල කාර්ය සහායක - 1
ප්‍රාථමික මට්ටම
කාර්යාල කාර්ය සහායක - 2

## ආයතනයේ පරිපාලන අංශය පිළිබඳ සමාලෝචනය

පරිපාලන අංශයේ ප්‍රධානියා සහකාර අධ්‍යක්ෂිකා වන අතර ආයතනයේ සාමාන්‍ය පරිපාලන කටයුතු වල වගකීම ඇය විසින් දරයි. කාර්ය මණ්ඩල බඳවා ගැනීම්, සේවක උසස් වීම්, මානව සම්පත් සංවර්ධනය, සේවක ගැටළු ආදී සියළු කටයුතු පරිපාලන අංශය විසින් මෙහෙයවයි.. ආයතනයේ ගොඩනැගිලි අළුත්වැඩියා හා වැඩි දියුණු කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය සියළුම අයිතමයන් ප්‍රසම්පාදන කටයුතු කරනු ලබන්නේ පරිපාලන අංශය විසිනි. 2016 වර්ෂය තුළ අනුමත කාර්ය මණ්ඩල පටිපාටිය අනුව පුරප්පාඩු වූ තනතුරු බඳවා ගැනීම සඳහා දැන්වීම් පල කරන ලදී.

අතුරුගිරිය නේවාසිකාගාර කළමනාකරු, ශ්‍රව්‍ය දෘශ්‍ය නිලධාරී, පුස්තකාලාධිපති සහ මුද්‍රණ සහකාර තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. පසුගිය වසර වල පුරප්පාඩුව පැවති නේවාසිකාගාර කළමනාකරු තනතුර සම්බන්ධ වගකීම් අත්දැකීම් බහුල වැඩ අධීක්ෂක විසින් ආවරණය කර ඇත. ප්‍රසම්පාදන නිලධාරියෙකු බඳවා ගන්නා තුරු ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ කටයුතු කළමනාකරණ සහකාරවරුන්ගෙන් සැදුම්ලත් මිලදී ගැනීමේ කමිටුවක් විසින් සිදු කරන ලදී. මිලදී ගැනීමෙ කටයුතු වල විනිවිදභාවය තහවුරු කිරීම සඳහා මෙම කමිටුවේ සාමාජිකයින් මාස හයකට (6) වරක් වෙනස් කරනු ලැබේ.

අප ආයතනය විසින් අතුරුගිරිය හා බොගවන්තලාව මධ්‍යස්ථානයන්හි නවාතැන් පහසුකම් අවශ්‍ය වන බාහිර ආයතන සඳහා නවාතැන් පහසුකම සැපයීමේ කටයුතු ද සිදු කරනු ලබයි. ආයතනයේ පවත්නා සේවාවන්හි ගුණාත්මකභාවය ඉතා උසස් අන්දමින් වැඩි දියුණු කිරීමට කටයුතු යොදා ඇති අතර එමගින් ආයතන උපයනු ලබන කුලී ආදායම ඉහල නැංවීම අපේක්ෂා කරයි. 2016 වසර තුළ කුලියට දීමෙන් ජනනය කල මුදල රුː මිලියන 14,232 කි.

## සේවක ප්‍රතිලාභ

සේවකයන්ගේ වෘත්තීය වර්ධනය සඳහා ආයතනික කළමනාකාරීත්වය විසින් සේවකයන්ගේ කුසලතා, දැනුම වැඩි දියුණු කිරීම සහ සේවක ඉල්ලීම් පරිදි දේශීය හා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම සිදු කරනු ලබයි. 2015 වසරට පෙර පැවැති ආයතනික සුභ සාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය 2016 වසරේ දී තව දුරටත් පවත්වා ගෙන ගියේ ය.

## ආයතනයේ මූලික ක්‍රියාකාරකම්

1979 අංක 45 දරන පනත හා එහි සංශෝධනයන්ට අනුව, ආයතනයේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ කුඩා වතු හිමියන් ඇතුළු වැවිලි ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ට පුහුණු හා ඉගෙනුම් අවස්ථා සැපයීමයි. වැවිලි ක්ෂේත්‍රය, තේ, පොල්, රබර්, උක්, කටු පොල්, තල්, කජු හා කුරුඳු ආදී වාර්ෂික භෝග වලින් සමන්විත වේ. ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ආයතනයේ මූලික ක්‍රියාකාරකම් පහත පරිදි ප්‍රධාන කාණ්ඩ 7 ක් යටතේ දැක්විය හැක.

### අ) අධ්‍යාපනික වැඩසටහන්

පාඨමාලා සඳහා සහභාගී වන්නන්ගේ අධ්‍යාපනික සුදුසුකම් හා නිපුණතාවන් වැඩි දියුණු කිරීමේ අරමුණින් අධ්‍යාපනික පාඨමාලා සැලසුම් කර ඇත.මෙම පාඨමාලා සඳහා සහතිකපත් පිරිනැමීම සඳහා, පාඨමාලා වලට සහභාගී වන්නන්ගෙන් තෘප්තිමත් විය හැකි ආකාරයේ අධ්‍යාපන වාර්තාවක් පවත්වාගෙන යාම හා ඔවුන් ලියාපදිංචි වී ඇති

පාඨමාලා මොඩියුල වල සඳහන් කර ඇති වගකීම් ඉටු කිරීම අවශ්‍යය වේ. අධ්‍යාපනික වැඩසටහන් වල පහත සඳහන් පාඨමාලාවන් ඇතුලත් වේ.



- BSc වැවිලි කළමනාකරණ උපාධිය. (වයඹ විශ්ව විද්‍යාලය සමඟ එක්ව)
- ජාතික වැවිලි කළමනාකරණ ඩිප්ලෝමාව.
- වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව.
- වැවිලි ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව.
- පොත් තැබීම හා වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව.
- මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව.
- ව්‍යාපාරික ඉංග්‍රිසි සහතිකපත්‍ර පාඨමාලාව.
- දෙමළ භාෂාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව.
- තේ නිෂ්පාදනය සහ තේ කර්මාන්තශාලා කළමනාකරණය පිළිබඳ ජාතික සහතිකපත්‍ර විභාගය.
- වැවිලි ආධුනිකයින් සඳහා පුහුණු පාඨමාලාව.

## ආ) වෘත්තීය වැඩසටහන්



වෘත්තීය පාඨමාලා පැවැත්වීමෙහි ප්‍රධාන අරමුණ වනුයේ වතු අධ්‍යාපනයෙහි විවිධ පැතිකඩයන් පිළිබඳ න්‍යායාත්මක / ප්‍රායෝගික දැනුම සහ කුසලතා ලබා දීමයි. වැඩසටහන් සඳහා සහභාගී වන්නන්ගේ වෘත්තීය අපේක්ෂාවන් තක්සේරු කිරීම හා වැඩි දියුණු කිරීම සඳහාත් ආයතනය සඳහා ඔවුන්ගේ වටිනාකම් වැඩි දියුණු කිරීම සඳහාත් මෙම පාඨමාලාවන් සැලසුම් කර ඇත.

ආයතනය විසින් පවත්වනු ලබන වෘත්තීය වැඩසටහන් පහත පරිදි වේ.

- තේ නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය
- රබර් නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය
- පොල් සැකසුම් (තාක්ෂණ හා ප්‍රායෝගික)
- භාෂා ප්‍රවීණතා විභාගය
- තේ ශෂ්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තීය වැඩසටහන
- රබර් ශෂ්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තීය වැඩසටහන

**(ඇ) නිපුණතා සංවර්ධන වැඩසටහන්**

මෙම ප්‍රභේදය යටතේ ඇති වැඩසටහන් විශේෂයෙන්ම නිර්මාණය කර ඇත්තේ විශේෂිත රැකියා සඳහා සෘජුවම අදාල වන කුසලතා හා හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහාය.වැඩසටහන් සඳහා සහභාගීවන්නන්ව රැකියා විස්තරයට අදාලව නවීන තාක්ෂණය හා වැඩි දියුණු කරන ලද ක්‍රමවේදයන් සමඟ සමීප කර වීම මේ තුලින් අපේක්ෂා කරනු ලබයි.

ආයතනය විසින් පහත සඳහන් නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

- වැඩමුළු , සම්මන්ත්‍රණ හා සම්මේලන
- කුසලතා සංවර්ධන වැඩසටහන්
- කම්කරු සංවර්ධන වැඩසටහන්
- කළමනාකරණ සංවර්ධන වැඩසටහන්
- කුඩා වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන්



ඈ) වැවිලි කලමනාකරණයට අදාලව ප්‍රකාශන නිකුත් කිරීම. (වැවිලි කළමනාකරණය සම්බන්ධ සඟරා , පුවත් පත්‍රිකා, ශිෂ්‍ය අත්පොත හා අනෙකුත් වාර සඟරා)

ඉ) වැවිලි කළමනාකරණය පිළිබඳ පර්යේෂණ හා උපදේශන සේවා සැපයීම හා රාජ්‍ය/පෞද්ගලික අංශයේ සංවිධාන සඳහා සේවකයන් බඳවා ගැනීමට හා ප්‍රවර්ධනය කිරීමට අදාල පරීක්ෂණ හා විභාග. (වාචික සහ ලිඛිත)

ඊ) සුදුසුකම් ලබන වතු විධායකයින්ට වෘත්තීය සාමාජිකත්ව ප්‍රධානය කිරීම. (ගරු සාමාජිකත්ව , හවුල් සාමාජිකත්ව , ආශ්‍රිත සාමාජිකත්ව හා ශිෂ්‍ය සාමාජිකාව)

උ) පුහුණු වැඩසටහන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් පැවැත්වීම සඳහා බාහිර ආයතන සඳහා ආයතනයේ පහසුකම් (ආහාර පාන , නවාතැන් සහ දේශන ශාලා) සැපයීම.





## <u>පුහුණු වැඩසටහන් වල ප්‍රගති සමාලෝචනය</u>

ආයතනය විසින් මූලිකවම ප්‍රධාන කොටස් 2 ක් යටතේ පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. එනම් වැවිලි සමාගම් සඳහා ආදායම් උත්පාදන වැඩසටහන් සහ රාජ්‍ය අරමුදල් භාවිතයෙන් කුඩා වතු අංශ සඳහා නොමිලේ පවත්වනු ලබන ධාරිතා වර්ධන වැඩසටහන්ය. වැවිලි ක්ෂේත්‍රයට අවතීර්ණ වීමට අපේක්ෂාවෙන් සිටින තරුණ පරපුරේ නිපුණතාවය වර්ධනය කිරීම සඳහා 2016 වසරේදී ජාතික වෘත්තීය සුදුසුකම් NVQ රාමුව යටතේ පාසැල් හැර යන සිසුන්ට වැඩ සටහන් ආරම්භ කරන ලදී.

## <u>ආදායම් උත්පාදන වැඩසටහන්</u>

ආයතනයට ආදායම් උත්පාදනය කිරීම සඳහා ආයතනය විසින් 2016 වසරේදී පහත දැක්වෙන අධ්‍යාපනික හා වෘත්තීය වැඩසටහන් ආරම්භ කර ඇත.

| අංකය | වැඩසටහනේ නම සහ කාණ්ඩය | පැවැත්වූ වැඩසටහන් ගණන | එක්එක් වැඩසටහනට ගත වූ කාලය | සහභාගීවූ ගණන |
|---|---|---|---|---|
| 01 | වැවිලි කළමනාකරණය පිළිබඳ BSc උපාධිය | 01 | අවුරුදු 03 | - |
| 02 | තේ නිෂ්පාදනය හා කර්මාන්තශාලා පරිචය පිළිබඳ වෘත්තීය වැඩසටහන | 01 | දින 11 | 27 |
| 03 | වැවිලි ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | මාස 12 | 14 |
| 04 | පොත් තැබීම හා වැවිලි ගිණුම්කරණය පිළීබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | මාස 12 | 9 |

| | | | | |
|---|---|---|---|---|
| 05 | වැව්ලි කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව- ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍ය | 02 | මාස 6 | 28 |
| 06 | තේ කර්මාන්තශාලා නිළධාරීන්ගේ කුසලතා වර්ධනය | 01 | දින 5 | 15 |
| 07 | මූලික කටු පොල් පාඨමාලාව | 01 | දින 1 | 42 |
| 08 | කළමනාකරණ සංවර්ධන වැඩසටහන් | 07 | දින 1/2 | 243 |
| 09 | තාක්ෂණික සංවර්ධන වැඩසටහන් | 01 | දින 3 | 15 |
| 10 | විශේෂ වැඩසටහන් | 06 | දින 1 | 193 |
| | **එකතුව** | **22** | - | **587** |

**(වගුව 1)**

මීට අමතරව පෙර වසරේදී ආරම්භ කරන ලද ඇතැම් අධ්‍යයන පාඨමාලා 2016 වර්ෂයේදී අඛණ්ඩව කර ගෙන යන ලදී. ඒවා පහත සඳහන් පරිදි වේ.

| අංකය | වැඩසටහන සහ අංශය | පැවැත් වූ වැඩසටහන් ගණන | එක්එක් වැඩසටහනට ගත වූ කාලය | සහභාගීවූ ගණන |
|---|---|---|---|---|
| 01 | වැවිලි කළමනාකරණය පිළිබඳ B.Sc. උපාධිය | 01 | අවුරුදු 03 | |
| 02 | වැවිලි කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව | 01 | මාස 18 | 10 |
| 03 | වැවිලි ව්‍යාප්ති කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | 01 | මාස 18 | 17 |
| 04 | ව්‍යාපාර සන්නිවේදනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව | 01 | මාස 12 | 11 |
| 05 | වැවිලි ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | මාස 14 | 14 |
| 06 | පොත් තැබීම සහ වැවිලි ගිණුම්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 01 | මාස 12 | 9 |
| | එකතුව | 06 | | 61 |

**(වගුව 2)**

## ආදායම් උත්පාදන වැඩසටහන් වල ලාභ අලාභ විශ්ලේෂණය

ජාතික අයවැය වෙත බර පැටවීමකින් තොරව, නාමික ලාභාන්තය සමඟ වියදම පියවා ගනිමින් ආයතනයේ කටයුතු පවත්වාගෙන යාමට, ආයතනය විසින් විශේෂයෙන්ම වැවිලි අංශය සඳහා ආදායම් උත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. 2016 වසර තුලදී පුහුණු ක්‍රියාකාරකම් වලින් මුළු පුහුණු ආදායම වන රු.මිලි 12.787 න් 51% සාමාන්‍ය ලාභාන්තිකයක් සහිතව රු.මිලි 6.553 ක ශුද්ධ ආදායමක් වාර්තා කර ඇත. පෙර වර්ෂයේ සංඛ්‍යා ලේඛණ අනුව මුළු පුහුණු ආදායම වන රු.මිලි 18.008 න් රු.මිලි 9.938 ක ශුද්ධ ආදායමක් එනම් 34% ක අඩු වීමක් වාර්තා වී ඇත. 2015 සහ 2016 වසර වල වැවිලි භෝග වල අවසන් නිෂ්පාදිත වල මිල පහල වැටුනු අතර එය 2016 වසරේදී පුහුණු ක්‍රියාකාරකම් පහත වැටීමට හේතුවක් විය. 2015 වසරට සාපේක්ෂව බලන විට ආයතනය 2015 වසරේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා විශාල වැඩසටහනක් පවත්වා ඇති අතර එය 2016 වසරේදී රු. මිලි 7.8 ක සෘණ ශුද්ධ ආදායමක් පෙන්වීමට හේතු විය.

එක් එක් පාඨමාලා වලට අදාලව ලාභ/අලාභ විශ්ලේෂණය පහත වගුවේ දැක් වේ.

| වැඩසටහනේ නම | ආදායම රු.මිලි | පිරිවැය රු.මිලි | ලාභ/අලාභ | ලාභ ආන්තිකය |
|---|---|---|---|---|
| **අධ්‍යාපනික හා වෘත්තීය** | 1.769 | 1.276 | 0.493 | 28% |
| **කලමනාකරණ සහ තාක්ෂණික සංවර්ධනය** | 1.369 | 0.722 | 0.647 | 47% |
| **කුසලතා සංවර්ධනය** | 0.252 | 0.124 | 0.128 | 51% |
| **වැවිලි ආධුනිකයන් සඳහා මූලික පාඨමාලා** | 2.520 | 0.590 | 1.930 | 76% |
| **විශේෂ පුහුණු** | 5.629 | 2.771 | 2.857 | 51% |
| **බාහිර විභාග වලින් උපයන ආදායම** | 1.248 | 0.750 | 0.498 | 40% |
| **එකතුව** | 12.787 | 6.233 | 6.553 | 51% |

**(වගුව 3)**

## ආදායම් උත්පාදන පුහුණු වැඩසටහන් වල ප්‍රගතිය - 2016

ආයතනය විසින් ක්‍රියාකාරී සැලැස්ම තුලින් අපේක්ෂිත ආදායම් උත්පාදන වැඩසටහන් 51 න්, වැඩසටහන් 22 ක් පවත්වා ඇත. 2016 වසරේදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාවේ ප්‍රගතිය 43.1% ලෙස වාර්තා වී ඇත. එපමණක් නොව ආයතනය විසින් 2015 වසරේදී ආරම්භ කළ වැඩසටහන් 6 ක අවසන් විභාග පවත්වා අවසන් කරන ලදී. වසර අවසානයේදී ආයතනය විසින් අපේක්ෂිත පුහුණු ආදායමට සමගාමීව 53% ක මූල්‍ය ප්‍රගතියක් ලබා ඇත. 2016 වසර සඳහා සැලසුම් කළ වතු කාර්ය මණ්ඩල පුහුණු වන්නන් 905 න් 587 ක් එනම් 64.8% ක ඉලක්කයක් සපුරා ගැනීමට හැකි විය.

පහත දැක්වෙන වගුව තුළින් 2016 වසරේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය නිරූපනය කරනු ලබයි.

පුහුණු වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| වැඩසටහනේ නම | ඇස්තමේන්තුව | | | සත්‍ය | | | ප්‍රගතිය (ප්‍රතිශත) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වැඩසටහන් ගණන | සිසුන් ගණන | ආදායම (රු.මිලි) | වැඩසටහන් ගණන | සිසුන් ගණන | ආදායම (රු.මිලි) | වැඩසටහන් ගණන | සිසුන් ගණන | ආදායම |
| අධ්‍යාපනික හා වෘත්තීය වැඩසටහන් | 11 | 155 | 5.910 | 4 | 51 | 1.80 | 36% | 32.9% | 30.4% |
| කළමනාකරණ හා තාක්ෂණික සංවර්ධන වැඩසටහන් | 16 | 240 | 2.062 | 8 | 258 | 1.37 | 50% | 107.5% | 66.4% |
| නිපුණතා සංවර්ධන වැඩසටහන් | 5 | 75 | 1.350 | 1 | 15 | 0.25 | 20% | 20% | 18.5% |
| මූලික පාඨමාලා | 4 | 60 | 0.510 | 1 | 42 | 0.04 | 25% | 70% | 7.8% |
| කම්කරු සංවර්ධන වැඩසටහන් | 3 | 45 | 0.080 | - | - | - | - | - | - |
| වැව්ලි පුහුණු වන්නන්ට මූලික පාඨමාලා | 2 | 30 | 2.70 | 2 | 28 | 2.52 | 100% | 93.3% | 93.3% |
| විශේෂ පුහුණු වැඩසටහන් | 10 | 300 | 10.00 | 6 | 193 | 5.59 | 60% | 64.3% | 55.9% |
| බාහිර විභාග වලින් උපයන ආදායම | - | - | 1.50 | - | - | 1.25 | - | - | 83.3% |
| **එකතුව** | 51 | 905 | 24.15 | 22 | 587 | 12.81 | 43.1% | 64.8% | 53% |

**(වගුව 4)**

කුඩා වතු හිමියන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් - 2016

වැව්ලි ක්ෂේත්‍රය සඳහා 75% ක පමණ දායකත්වයක් දක්වන කුඩා පරිමාණ වතු හිමියන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා ආයතනයට වගකීමක් ඇත. ආයතනය විසින් වැව්ලි ක්ෂේත්‍රයේ කුඩා වතු හිමියන්ගේ වැදගත්කම හඳුනා ගෙන කුඩා වතු හිමියන්ගේ ධාරිතාව සංවර්ධනය කිරීම යටතේ ආයතනයේ අයවැයෙන් සැළකිය යුතු මුදල් ප්‍රමාණයක් වෙන් කොට ඇත. කුඩා වතු හිමියන්ගේ දැනුම හා ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ආයතනය විසින් 2016 වසර සඳහා රු.මිලි 6.30 ක මූල්‍ය වෙන් කිරීමක් යටතේ පුහුණු වැඩසටහන් 126 ක් සැලසුම් කර ඇත. වසර

තුළදී ආයතනය විසින් කුඩා වතු හිමියන් සඳහා රු.මිලි 7.18 ක මුදලක් වැය කරමින් වැඩසටහන් 106 ක් පවත්වා ඇත. කුඩා වතු හිමියන් සඳහා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- මත් ද්‍රව්‍ය නිවාරණ
- ආකල්ප සංවර්ධන
- කලමනාකරණ සංවර්ධන
- ව්‍යවසාය සංවර්ධන
- තාක්ෂණික නිපුණතා සංවර්ධන

පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන් වල විස්තර පහත පරිදි වේ.

| වැඩසටහන් වර්ගය | අපේක්ෂා කල වැඩසටහන් | අපේක්ෂා කල සහභාගිවන්නන් | ඇස්තමේන්තු පිරිවැය | වැඩසටහන් ගණන | සහභාගිවන්නන් ගණන | පිරිවැය (රු.මිලි) |
|---|---|---|---|---|---|---|
| **රබර් කුඩා වතු හිමියන්** | 40 | 2000 | 2.00 | 67 | 4576 | 2.80 |
| **තේ කුඩා වතු හිමියන්** | 40 | 2000 | 2.00 | 26 | 2181 | 1.30 |
| **පොල් කුඩා වතු හිමියන්** | 40 | 2000 | 2.00 | 64 | 3817 | 2.94 |
| **අනෙකුත් බෝග** | 6 | 300 | 0.30 | 3 | 266 | 0.14 |
| **සාක්ෂාත් කර ගත් ගණන** | - | - | - | **160** | **10840** | **7.18** |
| **සැලසුම් කල ගණන** | **126** | **6300** | **6.30** | - | - | - |
| **ප්‍රගතිය** | - | - | - | **127%** | **172%** | **114%** |

**(වගුව 5)**

මෙම කොටසින් වසර තුළදී ආයතනය විසින් වැඩසටහන් 160 ක් පවත්වා 127% ක ප්‍රගතියක් වාර්තා කරමින් 2016 වසර සඳහා ඇස්තමේන්තු කල ප්‍රමාණයටත් වඩා සහ අපේක්ෂිත පුහුණු වන්නන් සංඛ්‍යාවද ඉක්මවමින් කුඩා වතු හිමියන් 10,840 ක් පුහුණු කරමින් 172% ක ප්‍රගතියක් වාර්තා කර ඇත.2016 වසරේදී මෙම වැඩසටහන් සඳහා වැය කර ඇති පිරිවැය රු.මිලි 7.18 කි. එය වෙන් කරන ලද අරමුදල් වලට සාපේක්ෂව 114% ක මූල්‍ය ප්‍රගතියකි .

 

<u>ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ යටතේ පාසැල් හැර ගිය සිසුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන්</u>

වැවිලි ක්ෂේත්‍රයට පිවිසීමට කැමති තරුණ පරපුරේ නිපුණතාවයන් වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික ක්‍රමවේදයක් යටතේ නවක සාමාජිකයන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට 2015 සහ 2016 වසර වලදී අරමුදල් වෙන් කර ඇත. වැවිලි අංශයේ අවශ්‍යතාව අනුව NVQ 04 මට්ටම දක්වා පහත පරිදි පාඨමාලාවන් 03ක් සකස් කර ඇත.

- තේ කර්මාන්තශාලා නිළධාරී
- තේ ක්ෂේත්‍ර නිළධාරී
- තේ කර්මාන්තශාලා කාර්මික

2016 අගෝස්තු වන විට තේ කර්මාන්තශාලා නිළධාරී හා තේ ක්ෂේත්‍ර නිළධාරී වැඩසටහන් ආරම්භ කිරීමට හැකි වූ අතර එම වැඩසටහනට සාර්ථක ලෙස සහභාගී වූ පාසැල් හැර ගිය තරුණ සිසුන් 32 ක් රැකියා සහතිකයක් පුහුණු කරන ලදී. මෙම වැඩසටහනට සහභාගී වූ සියළුම සිසුන් වැඩසටහන අවසන්වීමට පෙර රැකියා අවස්ථා ලබා ගත්හ.

 

**පෙර වසරට සාපේක්‍ෂව පුහුණු වැඩසටහන් ලබා ඇති ප්‍රගතිය.**

පසුගිය වසරේ පුහුණු සංඛ්‍යා ලේඛන සමඟ සසඳන විට 2016 වසරේදී වැඩසටහන් සංඛ්‍යාව, පුහුණු වූ සංඛ්‍යාව, පුහුණු ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කළ ආදායම සෘණාත්මක ප්‍රගතියක් වාර්තා කර ඇත. 2015 වසරේදී ගෝලීය වෙළඳපොලේ වැව්ලි නිෂ්පාදන සඳහා අඩු ශුද්ධ විකුණුම් සාමාන්‍යයක් වාර්තා කර ඇති අතර එය 2016 වසරේදී තවදුරටත් පහත වැටී ඇත. එපමණක් නොව 2016 වසරේදී බලාපොරොත්තු නොවූ කාලගුණික රටාවන් හේතුවෙන් වැව්ලි දිස්ත්‍රික්ක වල ගංවතුර, නායයෑම් ඇති විය. එය නිෂ්පාදන ධාරිතාව පහත වැටීමටත් ආයතනයේ ප්‍රධාන පාරිභෝගිකයන් වන වැව්ලි සමාගම් වල ලාභදායීත්වය පහත වැටීමට හේතු වේ. මෙවැනි පහත වැටෙන තත්වයක් තුළ ආයතන වලට ඔවුන්ගේ අනෙකුත් අත්‍යවශ්‍ය කැපවීම් සපුරාලීම සඳහා පුහුණු අයවැය කප්පාදු කිරීමට සිදු විය.

2015 වසර හා සසඳන විට වැඩ සටහන් පැවැත්වීම 26.6% කින් ද ආදායම් උත්පාදන වැඩසටහන් සඳහා සහභාගී වන්නන්ගේ ප්‍රමාණය 46.6% කින්ද පහත වැටී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2015 වසරට සාපේක්ෂව 2016 වසරේදී පුහුණු ආදායම 28.8% කින් පහත වැටී ඇත.

කුඩා වතු හිමි අංශය සැලකිල්ලට ගැනීමේදී පුහුණු වැඩසටහන් 18.3% කින්ද වැඩසටහන් වල අඩු වීමට සමාන්තරව පුහුණු සඳහා සහභාගී වන්නන්ගේ සංඛ්‍යාව 15.4% කින්ද අඩු වී ඇත. පසුගිය වසරට සාපේක්ෂව ප්‍රගතියේ සිදු වූ මෙම අඩු වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ වැව්ලි භෝග වල මිල පහත වැටීමත් සමඟ පොදු ජනතාවගේ සහ වැව්ලි සමාගම් වල ප්‍රමුඛතාවයන් පිළිබඳ අවධානය මඟ හැරීමයි. කෙසේ වෙතත් එය වැව්ලි ප්‍රජාවගේ පුහුණු සංස්කෘතියම අහිතකර ලෙස බල පා ඇත.පහත දැක්වෙන වගුව (අංක 6) මඟින් 2015 වසරට සාපේක්ෂව 2016 වසරේදී ඇති වූ සෘණාත්මක බලපෑම පෙන්නුම් කරයි.

| | 2015 | 2016 | ප්‍රතිශතය වැඩි වූ/(අඩු වූ) |
|---|---|---|---|
| **වැඩසටහන් ගණන (ආදායම් උත්පාදන වැඩසටහන්)** | 30 | 22 | (26.6%) |
| **සහභාගී වූවන් ගණන (ආදායම් උත්පාදන වැඩසටහන්)** | 1101 | 587 | (46.6%) |
| **පුහුණු ආදායම (රු.මිලි)** | 18.008 | 12.81 | (28.8%) |
| **කුඩා වතු හිමියන් සඳහා වූ වැඩසටහන් ගණන** | 196 | 160 | (18.3%) |
| **පුහුණුව ලැබූ කුඩා වතු හිමියන් ගණන** | 12,825 | 10,840 | (15.4%) |
| **කුඩා වතු හිමියන්ගේ පුහුණුව සඳහා වැය වූ පිරිවැය** | 7.71 | 7.18 | (06.8%) |

**(වගුව 6)**

**වෙනත් සංවිධාන සඳහා විභාග පැවැත්වීම**

ජාතික වැව්ලි කළමනාකරණ ආයතනයේ එක් අරමුණක් වනුයේ වැව්ලි කළමනාකරණය සම්බන්ධයෙන් විවිධ විෂයන් සඳහා උපදේශන සේවා සැපයීමයි. 1987 සිට ආයතනය විසින් වැව්ලි අංශයේ විශේෂඥයන් වූ විවිධ රාජ්‍ය/පෞද්ගලික අංශ ආයතන වල සේවකයන් ප්‍රවර්ධනය කිරීම සහ නව සේවකයන් බඳවා ගැනීමට අදාල වන විභාග පැවැත්වීමේ පහසුකම් සපයනු ලැබේ. පෙර වසර වල අත්දැකීම් වලට අනුව 2016 වසරේදී ආයතනය විසින්

විභාග 23 ක් පවත්වා රු.මිලි 1.248 ක ආදායමක් උපයා ඇත. පහත දැක්වෙන වගු අංක 7 න් එවැනි විභාග වල තොරතුරු නිරූපනය කරනු ලබයි.

| සංවිධානය | විභාග ගණන | අයදුම්කරුවන් ගණන | ඉපයූ ආදායම් (රු.) |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා තේ මණ්ඩලය** | 18 | 199 | 668,113.50 |
| **කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය** | 2 | 109 | 218,940.00 |
| **පොල් පර්යේෂණ ආයතනය** | 1 | 13 | 24,992.50 |
| **තේ පර්යේෂණ ආයතනය** | 2 | 67 | 229,352.00 |
| **පොල් සංවර්ධන අධිකාරිය** | 1 | 31 | 53,040.00 |
| **තුරුසවිය අරමුදල** | 2 | 16 | 53,722.00 |
| **එකතුව** | 23 | 435 | 1,248,160.00 |

**( වගුව 7)**

## වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය



වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය යනු වැවිලි කර්මාන්තය හා ඒ ආශ්‍රිත අංශ වල ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම පරිමාණ විධායක නිලධාරීන් වෙනුවෙන් නිර්මාණය කර ඇති කළමනාකරණ හා තාක්ෂණික සංවර්ධනයට මග පෙන්වූවකි.

2006 වසර වන තෙක් වැවිලි අංශයේ කාර්ය මණ්ඩලයට එම ක්ෂේත්‍රය හා සම්බන්ධව උසස් අධ්‍යාපනයක් ලැබීමේ අවස්ථාවක් නොතිබුනු අතර වැවිලි අංශය හා සම්බන්ධව නිපුණත්වය ළඟා කර ගැනීමටත් , කළමනාකරණ නිපුණතා සංවර්ධනය කර ගැනීමටත් හැකි මාර්ග හා උපක්‍රම ගවේෂණය කිරීමේ අවශ්‍යතාවක් පැන නැගී තිබුණි.ඊට අමතරව මෙම ක්ෂේත්‍රයේ තිබූ ඉල්ලුම සැපිරීමේ අවශ්‍යතාවත් ,වැවිලි කළමනාකරුවන්ව වෘත්තීයමය ලෙස අනාගත අභියෝගයන්ට මුහුණ දීමට හැකි වන පරිදි සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවත් පැන නැගුණි. කර්මාන්තයේ ඵලදායීතාවය,ලාභදායීත්වය හා තිරසර බව සහතික කිරීමෙහි ලා වැවිලි අංශයේ ජ්‍යෙෂ්ඨ හා මධ්‍යම මට්ටමේ විධායක නිලධාරීන්ට ක්ෂුද්‍ර හා සාර්ව මට්ටමේ විද්‍යානුකූල,න්‍යායාත්මක සහ කළමනාකරණ නිපුණත්වයෙන් යුතු උසස් උපාධියක් පිරිනැමීම අත්‍යවශ්‍ය කරුණකි.මෙම අරමුණ ඉටු කිරීම සඳහා පුළුල් අධ්‍යාපනික වැඩසටහන් නිර්මාණය කළ යුතුය.බොහෝ පරිශ්‍රමයක් දැරීමෙන් අනතුරුව වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධි වැඩසටහන 2006 වසරේදී දියත් කෙරුණු අතර එය වයඹ විශ්වවිද්‍යාලය හා NIPM ආයතනය ඒකාබද්ධව

පිරිනමමින් පැවතුන රික්තය පුරවන ලදි.මෙය වසර 03ක වැඩසටහනක් වන අතර දීපව්‍යාප්ත අධ්‍යයන පාඨමාලාවක් ලෙස පවත්වනු ලබයි. ආරම්භයේදී වැවිලි නිලධාරීන් 21 දෙනෙකු මෙම පාඨමාලාව සඳහා ලියාපදිංචි වුනු අතර 17 දෙනෙකු 2008 වසරේදී පාඨමාලාව අවසන් කරන ලදි.

එක් එක් වසර වලදී ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාව හා එම වැඩසටහන සාර්ථකව අවසන් කළ සිසුන් සංඛ්‍යාව පිළිබද විස්තර පහත දැක්වේ.

| | **වසර** | **ලියාපදිංචි සිසුන් ගණන** | **නිම කළ සිසුන් ගණන** |
|---|---|---|---|
| 1 | 2006 | 21 | 16 |
| 2 | 2007 | 17 | 11 |
| 3 | 2008 | 35 | 21 |
| 4 | 2009 | 34 | 16 |
| 5 | 2010 | 47 | 29 |
| 6 | 2011 | 32 | 17 |
| 7 | 2012 | 54 | 37 |
| 8 | 2013 | 81 | |
| 9 | 2014 | 91 | |
| 10 | 2015 | 106 | |
| 11 | 2016 | 105 | |

**(වගුව 8)**

2014 සිට 2016 දක්වා ක්‍රියාත්මක වෙමින් පවතින වැඩසටහන් වල ප්‍රතිඵල තවමත් අවසන් කර නොමැත.ඉහත වගුවට අනුව විද්‍යාවේදී උපාධිය සඳහා ඇති ඉල්ලුම ඉහළ ගොස් ඇති අතර එය ධනාත්මක ප්‍රවණතාවයකි. ජාතික වැවිලි කලමනාකරණ ආයතනය හා වයඹ විශ්ව විද්‍යාලය ඒකාබද්ධව මෙම සහතිකය පිරිනමනු ලබයි. වයඹ විශ්ව විද්‍යාලය සමඟ ඒකාබද්ධ උපාධියක් පිරිනැමීම අප ආයතනයට ඉතාමත්ම ගෞරවයක් වේ.

## ආයතනයේ වෘත්තීය සාමාජිකත්වය

1987 අංක 05 දරන පනතේ සඳහන් නිර්නායක හා කොන්දේසි මත පදනම්ව ආයතනය විසින් යෝග්‍ය සාමාජිකයන් සඳහා වෘත්තීය සාමාජිකත්වය පිරිනැමීම අඛණ්ඩව කරගෙන යනු ලබයි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුල ආයතනය විසින් එක් ආශ්‍රිත සාමාජිකයෙකු සම සාමාජිකයෙකු ලෙස උසස් කළ අතර , එක් විධායක නිළධාරියෙකුට සම සාමාජිකත්වයක් පිරිනමන ලදී. වසර අවසානයේදී එක් එක් ඛාණ්ඩ යටතේ සිටින මුළු වෘත්තීය සාමාජිකයන් ගණන පහත පරිදිය.

| | | |
|---|---|---|
| ගරු සාමාජිකත්ව | - | 20 |
| සම සාමාජිකත්ව | - | 208 |
| ආශ්‍රිත සාමාජිකත්ව | - | 20 |
| ශිෂ්‍ය සාමාජිකත්ව | - | 02 |
| | | 250 |



**ප්‍රකාශන**

ආයතනය විසින් 2015 වසරට පෙර සඟරා නිකුතු 2ක් සහ පුවත් පත්‍රිකා 4ක් ප්‍රකාශයට පත් කරන ලදී. 2016 වර්ෂයේදී මෙම සඟරාව හා පුවත් පත්‍රිකාව යන දෙක වෙනුවට "වැවිලි සවිය" නමින් නව සඟරාවක් නිකුත් කිරීමට තීරණය කරන ලදී. එහි බෝග පර්යේෂණ ආයතනයේ විද්‍යාඥයින්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, වෘත්තීය වැවිලිකරුවන්, කුඩා වැවිලි හිමිකරුවන් විසින් වැවිලි කර්මාන්තය හා සම්බන්ධව භාෂා 3 කින් ලියන ලද ලිපි ඇතුළත් වේ. එහි කතෘ මණ්ඩලය, මහාචාර්ය මංගල ෆොන්සේකා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ආචාර්ය ප්‍රියානි සෙනෙවිරත්න මිය, රබර් පර්යේෂණ ආයතනය, බී.ඒ.ඩී සමන්සිරි මහතා, තේ පර්යේෂණ ආයතනය, ආචාර්ය කුසුම් විජේසිංහ මිය, පොල් වගා කිරීමේ මණ්ඩලය යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විතය. ප්‍රධාන කතෘ වනුයේ එස්.එම්.පී. ජයන්ත මහතාය.

**ආයතනය සපයන පහසුකම්**

**පුස්තකාල පහසුකම්**

ආයතනික පුස්තකාලයේ තේ, රබර්, පොල්, උක්, කජු සහ ගිණුම්කරණය, පොදු කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, අලෙවි කලමනාකරණය, උපාය මාර්ගික කළමනාකරණය, ධනාත්මක චින්තනය, කාල කළමනාකරණය, ඵලදායීතාවය, කාර්මික ආරක්ෂණය, ස්වස්ථාව හා තත්ත්ව කළමනාකරණය, ආදි වැවිලි කර්මාන්ත අංශයට අදාළ ග්‍රන්ථ 4000 කට වැඩි එකතුවක් ඇත. එහි බැහැර දෙන සහ පරිශීලන නමින් අංශ 2 ක් ඇත. දිගු කාලීන වැඩ සටහන්වලට සහභාගී වන පිරිසට සහ ආයතනික කාර්යය මණ්ඩලයට බැහැර දෙන අංශයේ ග්‍රන්ථ භාවිතා කල හැකි අතර කෙටිකාලීන වැඩසටහන් සඳහා සහභාගී වන පිරිස, කාර්යය මණ්ඩලය ආයතනයේ බාහිර සම්පත්දායක මණ්ඩලය හා ප්‍රදේශයේ පාසැල් ශිෂ්‍යයන් සඳහා පරිශීලන අංශය භාවිතා කල හැකිය.



## නවාතැන් පහසුකම්



ආයතනය සතුව අධ්‍යාපනික හා පුහුණු මධ්‍යස්ථානයකට අවශ්‍ය ප්‍රමාණවත් යටිතල පහසුකම් ඇත. දේශීය හා විදේශීය ඉල්ලුම තෘප්ත කිරීමට හැකිවන පරිදි ආයතනය වැඩි දියුණු කිරීමට හා නවීකරණය කිරීමට ජාතික අයවැය මගින් වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කරනු ලබයි. අතුරුගිරිය පුහුණු මධ්‍යස්ථානයේ වායු සමීකරණය කරන ලද දේශණ ශාලා 3 ක් හා ශ්‍රවණාගාරයක් ඇත. ශ්‍රවණාගාරයේ වරකට පුද්ගලයින් 200 කට ඉඩ පහසුකම් සැලසිය හැකිය. 60 දෙනෙකු සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයිය හැකිය.

**නේවාසිකාගාරය - අතුරුගිරිය**



බොගවන්තලාව තෙරේසියා වත්තේ පිහිටා ඇති රංජන් විජේරත්න වැවිලි පාසල (RWPS) යනු අපගේ අනෙක් ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානය යි. එය අනිවාර්යෙන්ම නව පුහුණු පහසුකම් සහිතව වැඩි දියුණු විය යුතු ය. එහි ශ්‍රවණාගාරයේ පුද්ගලයන් 100 කට ආසන්න ප්‍රමාණයක ධාරිතාවක් ඇති අතර, 50 දෙනෙකුට ඉඩ පහසකම් සැපයිය හැකි මධ්‍යම පරිමාණ දේශන ශාලා 2 ක් ඇත.




**නේවාසිකාගාරය - බගවන්තලාව**

බොගවන්තලාව නේවාසිකාගාරයේ වරකට පුද්ගලයන් 70 කට ආසන්න ප්‍රමාණයකට නවාතැන් පහසුකම් සැපයිය හැකිය. මෙහි විශාල භෝජනාගාරයක්, කාර්යාල කාමර 3 ක් හා ග්‍රන්ථ 600 කට වඩා ඇති

කුඩා පුස්තකාලයක් ඇති අතර නේවාසිකාගාර කළමණාකරු සඳහා බංගලාවක් ඇත. මෙහි නේවාසිකාගාර කළමණාකරු හා කාර්යාල කාර්ය සහයක හැරුණු විට කිසිදු ස්ථිර සේවකයෙකු නොමැත. එම නිසා පුහුණු සැසි සඳහා අධ්‍යක්ෂතුමාගේ පූර්ව අනුමැතිය යටතේ කොන්ත්‍රාත් පදනම මත සේවකයන් බඳවා ගනී. මෙහි අනියම් පදනම යටතේ සේවකයන් 3 දෙනෙකු සහ එක් මුරකරුවකු සේවය කරන අතර ආයතනයේ පුහුණු වැඩසටහන් සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කොරියානු වැඩසටහන්වලට අදාළ සියලුම පහසුකම් මොවුන් විසින් නේවාසිකාගාර කළමනාකරුගේ අධීක්ෂණය යටතේ සපයනු ලබයි.

## මූල්‍ය සාමාලෝචනය

### කාර්යය සාධනය

ආයතනය විසින් පසුගිය වසරේ ආදායම වන රු.මිලි 84.796 ට සාපේක්ෂව 2016 වසරේදී රු.මිලි 101.828 ක මුළු ආදායමක් වාර්තා කර ඇත. මෙම ආදායම සඳහා ප්‍රධාන වශයෙන් රජයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රදාන පිළිවලින් රු. මිලියන 38.961 ක් හා රු. මිලියන 32.689 ලෙස දායක වී ඇත. රු. මිලියන 12.787 වන මුළු පුහුණු ආදායම මෙම උපයන ලද ආදායම සඳහා සතුටුදායක ලෙස දායකත්වය ලබා දී ඇත.

පෙර වසර වල අත්දැකීම් වලට අනුව බොගවන්තලාව හා අතුරුගිරිය ප්‍රදේශ වල පිහිටා ඇති පුහුණු මධ්‍යස්ථාන දෙකෙහි නවාතැන් පහසුකම් ලබා දීම ආදී ආයතනය සතු වත්කම් බාහිර පුද්ගලයන්ට කුලී පදනම මත ලබා දීම තුලින් උපයා ඇති ආදායම රු.මිලි 14.232 කි. 2016 මූල්‍ය වර්ෂයේදී ආයතනය විසින් රු.මිලි 14.757 ක ශුද්ධ අතිරික්තයක් උත්පාදනය කර ඇත.

පෙර වසරට සාපේක්ෂව 2016 වසරේ මූල්‍ය කාර්ය සාධනය පහත සඳහන් වේ.

| | 2015 | 2016 | වෙනස | ප්‍රධාන සාධකය |
|---|---|---|---|---|
| **රජයේ පුනරාවර්තන ප්‍රදාන** | 28.502 | 38.961 | 36.69% | භාණ්ඩාගාරය විසින් 2016 වසරේදී ප්‍රමාණවත් අරමුදල් නිදහස් කරන ලදී. |
| **ප්‍රාග්ධන දීමනා වලින් ලද ආදායම්** | 23.072 | 32.689 | 41.68% | ප්‍රාග්ධන දීමනා වල වැඩි වීම හා අරමුදල් උපයෝජනය වැඩිවීම. |
| **පුහුණු ආදායම්** | 18.008 | 12.787 | (28.99%) | අනපේක්ෂිත මිල පහත වැටීම හා වෙනත් පාරිසරික/ස්වභාවික ගැටළු හේතුවෙන් වැඩසටහන් සංඛ්‍යාව අඩු වීම. |
| **පහසුකම් කුලියට ලබා දීමෙන් ලබන ආදායම (බොගවන්තලාව, අතුරුගිරිය)** | 13.575 | 14.232 | 4.83% | නවාතැන් පහසුකම් සීමිත වුවද සුළු වර්ධනයක් දැකිය හැකිය. |
| **ඉපැයූ මුළු ආදායම්** | 33.222 | 30.178 | 9.16% | පුහුණු වැඩසටහන් සංඛ්‍යාව අඩු වීම හේතුවෙන් පුහුණු ආදායම ආදායම පහත වැටී ඇත. |
| **වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ** | 30.907 | 31.834 | 2.99% | රජයේ සේවකයන්ගේ වාර්ෂික වැටුප් වර්ධනය. |
| **මුළු පුනරාවර්තන වියදම්** | 84.163 | 87.070 | 3.45% | සුළු වැඩිවීමක් දැකිය හැකිය. |
| **ක්ෂය කිරීම්** | 17.740 | 18.951 | 6.82% | නව මිලදී ගැනීම් හේතුවෙන් වැඩි වී ඇත. |
| **අතිරික්තය** | 0.632 | 14.757 | 2234% | රජයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන ප්‍රතිපාදන වැඩිවීම හේතුවෙන් වර්ධනය වී ඇත, ගිණුම්කරණ ප්‍රමිත අනුව මුළු රාජ්‍ය ප්‍රතිපාදන ආයතනයේ ආදායම ලෙස සැලකිල්ලට ගෙන ඇත. |

## ද්‍රවශීලතාවය

පසුගිය වසරේ **1.77** වරක් පැවති ද්‍රවශීලතා අනුපාතය සමග සැසදීමේදි **2016** වසරේදි **2.04** වරක් දක්වා සුළු වර්ධනයක් පෙන්නුම් කර ඇත. මෙමගින් ද්‍රවශීලතා වත්කම්වල වර්ධනයක් පෙන්නුම් කර ඇත.

## ප්‍රාග්ධන වියදම්

ආයතනය විසින් ප්‍රාග්ධන වියදම් අයවැයෙහි සැලසුම් කල පරිදි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම අඛණ්ඩව සිදු කරමින් රු.මිලි 27.71 ක මුදලක් ස්පෘශ්‍ය ස්ථාවර වත්කම් වල ආයෝජනය කරන ලදී. තවදුරටත් ආයතනය විසින් ප්‍රාග්ධන වියදම් අයවැය යටතේ කුඩා වතු හිමියන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා රු.මිලි 7.18 ක මුදලක්ද රු. මිලියන 1.266 ක් මුදලක් ජාතික නිපුනතා සහතික වැඩසටහන් පැවැත්වීම සඳහා ද අයොජනය කර ඇත. 2016 සඳහා මුළු ප්‍රාග්ධන වියදම රු.මිලි 36.94 කි.

පහත දැක්වෙන වගුවෙන් 2016 වසරේ ප්‍රාග්ධන වියදමෙහි ඇස්තමේන්තුගත හා සත්‍ය කාර්ය සාධනය පෙන්නුම් කරයි.

2016 වසර සඳහා ප්‍රාග්ධන වියදමෙහි ඇස්තමේන්තුගත සහ සත්‍ය කාර්ය සාධනය (රු.මිලි)

| ප්‍රාග්ධන අයිතම | ඇස්තමේන්තුව | සත්‍ය | ප්‍රගතිය |
|---|---|---|---|
| **ප්‍රාග්ධන වත්කම් අලුත් වැඩියාව හා ප්‍රතිෂ්ඨාපනය** | 17.75 | 13.62 | 76.7% |
| **ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම** | 16.25 | 14.09 | 86.7% |
| **වෙනත් ආයෝජන** | 2.00 | 0.78 | 39.0% |
| **ධාරිතා සංවර්ධන වැඩසටහන්** | 10.00 | 8.45 | 84.5% |
| **එකතුව** | 46.00 | 36.94 | 80.3% |

මූලිකවම ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාග්ධන වියදම් සඳහා රු. මිලි 25.0 වෙන් කල අතර ආයතනය වෙනුවෙන් බස් රථයක් මිලදී ගැනීම සඳහා රු. මිලි 9.00 ක අතිරේක මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමක් වසර තුලදි සිදු කරන ලදී. ප්‍රධාන ප්‍රාග්ධන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

- ආසන 34 රෝසා බස් රථයක් මිලදී ගැනීම.
- ආයතන සංකීර්ණය , කොරිඩෝ, අධ්‍යක්ෂකතුමාගේ කාමරය හා ඒ අසල ඇති කාර්ය මණ්ඩල වැසිකිලි පද්ධතිය අලුත් වැඩියා කිරීම.
- ආයතනයේ විද්‍යුත් පැනල අළුත් වැඩියා කිරීම.
- දේශනශාලා සඳහා වායුසමීකරන පද්ධතියක් ස්ථාපිත කිරීම.
- කුඩා වතු හිමියන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 160 ක් පැවැත්වීම

## අතිරික්තය/ (හිඟය)

පහත විමර්ශනයට අනුව ආයතනය විසින් රු. මිලි 18.95 ක් වූ ක්ෂය පිරිවැය අඩු කිරීමෙන් පසු රු. මිලි 14.757 ක අතිරික්තයක් වාර්තා කරන ලදී. 2015 මූල්‍ය තත්ව ප්‍රකාශයට අනුව ආයතනය විසින් රු. මිලි 0.632 ක අතිරික්තයක් වාර්තා කර ඇත. ආයතනය වෙත රු. මිලි 32.689 ක ප්‍රාග්ධන ප්‍රදානයක් හා රු. මිලි 38.961 ක් වූ පුනරාවර්තන ප්‍රදාන දීමනාවක් ලැබී ඇත. පෙර වර්ෂය සමග සැසදීමේදී අතිරික්තය වර්ධනය වීම සඳහා මෙම ප්‍රදානයන් ප්‍රාමාණික ලෙස දායක වී ඇත.




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|
| Series1 | -1.318 | 4.78 | 1.248 | -4.597 | 4.482 | -1.833 | 0.632 | 14.757 |

## ශුද්ධ වත්කම්

2016 දෙසැම්බර් 31 වන දිනට ආයතනයේ ශුද්ධ වත්කම් රු.මිලි 203.88 දක්වා වර්ධනය වී ඇත. එය පෙර වසරේ ශුද්ධ වත්කම් ප්‍රමාණය වන රු.මිලි 126.56 ට සාපේක්ෂව 61% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. 2015.12.31 දිනට පැවති විලම්බිත රජය ප්‍රදාන ශේෂ මුදල රාජ්‍ය ගිණුම් කරන ප්‍රමිතීන්ට අනුව රඳවාගත් ලාබ ගිණුම වෙත මාරු කිරීම මත රඳවාගත් ලාබ ශේෂය රු.මිලියන 51.765 ධන අගයක් ගෙන ඇත. මෙම ගැලපුම හා ප්‍රවර්ථන වසරේ ලාභය වැඩි වීම 2016 වසරේ ශුද්ධ වත්කම් රු.මිලි 203.88 දක්වා වැඩි වීමට හේතු විය. 2014 වසරේදී ආයතනය විසින් එහි වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී රු.මිලි 96.6 ක ප්‍රත්‍යාගණන අතිරික්තයක් සිදු වී ඇති අතර ඒ හරහා 2014 වසරේදී ශුද්ධ වත්කම් වල අගය ඉහල වැඩි වීමක් සිදු වී ඇත.




| | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|
| Series1 | 13.46 | 18.25 | 17 | 20.13 | 24.62 | 122.33 | 126.56 | 203.88 |

## මූල්‍ය තත්වය

මූල්‍ය තත්ව ප්‍රකාශයට අනුව 2016/12/31 දිනට ශුද්ධ වත්කම් රු.මිලි 203.88 වන අතර එය පෙර වසරේදී රු.මිලි 126.562 කි. මූල්‍ය ප්‍රකාශයන්ට අනුව ආයතනය පෙර වසරේ රු.මිලි 221.743 ක් මුලු වත්කම් අගයට සාපේක්ෂව මෙම වසරේදී රු.මිලි 228.849 ක මුළු වත්කම් ප්‍රමාණයක් වාර්තා කර ඇත. පෙර වසරේ මුළු වගකීම් රු.මිලි 95.181 ට සාපේක්ෂව මෙම වසර අවසානයේදී මුළු වගකීම් ප්‍රමාණය රු.මිලි 24.969 කි. ආයතනය විසින් සේවක ප්‍රතිලාභ සැලැස්ම සඳහා රු.මිලි 7.581 ක් වෙන් කර ඇති අතර සේවක ප්‍රතිලාභ වල වගකීම සුරක්ෂා කිරීම සඳහා ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර ඇත. 2016/12/31 දිනට මුළු ජංගම වත්කම් ප්‍රමාණය රු.මිලි 35.256 ක් වන අතර ජංගම වගකීම් රු.මිලි 17.277 කි.

## ආයතනය විසින් මුහුණ දෙන සංරෝධක

පෙර වසර වලදී ලද අත්දැකිම් වලට අනුව 2004 දී සිදු වු ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලියෙන් පසුව 2015 වසරේදීද ආයතනය විසින් සංරෝධක කිහිපයකට මුහුණ දෙන ලදි. පුහුණු අංශයේ පවතින කාර්ය මණ්ඩල හිඟය ඉන් එක් ප්‍රධාන සංරෝධකයකි. පුහුණු කාර්යය මණ්ඩලය 06 දෙනෙකු වන අතර සුදුසුකම් වලට සාපේක්ෂව ප්‍රමාණවත් වැටුප් පරිමාවන් නොතිබීම වැනි කරුණු හේතුවෙන් ආයතනය තුළ රැකියා අවස්ථා පැවතිය ද සේවකයින් අලුතින් බඳවා ගැනීමේ අපහසුතාවයන් පවතී. ශ්‍රී ලංකා හමුද 7 වන ඉංජිනේරු රෙජිමේන්තුව විසින් ආයතනය සතුව පවතින අක්කර 4.5ක භූමි භාගයක් අත්කර ගෙන සිටින බැවින් ආයතනයේ සේවක මණ්ඩලය සඳහා ප්‍රමානවත් සේවක නිල නිවාස පහසුකම් හිඟයක් පවති.

බොහෝ වැවිලි ව්‍යාපාර ආයතන ඔවුන්ගේ නිෂ්පාදන හා පරිපාලන කටයුතු වලට බාධා ඇතිවන බැවින් වල විධායක නිලධාරින්ව සතියේ දින වල පවතින දිගු කාලීන පුහුණු වැඩසටහන් වලට සහභාගි කරවීමට මැලිකමක් දක්වයි. එබැවින් පුහුණු වැඩසටහන් සති අන්ත වලදී පැවැත්වීමට ආයතනයට සිදු වූ අතර මෙය දේශන ශාලා වල හා නවාතැන් පහසුකම් සීමිත විම කෙරෙහි බලපා ඇත.

වැවිලි අංශය තරුණ පරම්පරාව අතර එතරම් ආකර්ෂණීය අංශයක් නොවන අතර පුහුණු වැඩසටහන් සඳහා පාසැල් හැරගිය පිරිසගේ සහභාගිත්වය අවම වේ. නව පරපුරේ නිපුනතාවය පිළිබඳව ගැටළු පැවතීම හේතුවෙන් වැවිලි කර්මාන්ත ආයතන විසින් පහසුවෙන් බඳවා ගැනීම් සිදු නොකරන තත්වයක් තුල තෝරාගත් වෘත්තීන් වල පාඨමාලා විෂයධාරා සංවර්ධනය කිරිම සඳහා ආයතනයට වැඩිපුර අරමුදල් ආයෝජනය කිරිමට සිදු වන අතර ඒ සඳහා උපදේශකවරයකුගේ සේවය ලබා ගැනීමේ දි ආයතනයට රාජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ පැවති දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවිය.

1980 වර්ෂයේදි කාර්යාලීය ගොඩනැගිලි සංකිර්ණයක් බවට පරිවර්තනය කරන ලද ගොඩනැගිලි සංකිර්ණය වසර 60 කට වඩ පැරණි බැවින් එය අලුත් වැඩියා කිරිමේ අදියර පසුකර ඇත. යටිතල පහසුකම් සංවර්ධනය යටතේ නව කාර්යලීය ගොඩනැගිලි ඉදිකිරිම අත්‍යවශ්‍යයෙන්ම සිදු කල යුතු කරුණකි.

වර්තමානයේ ආයතනය සතුව පවතින වාහන 08 න් 06ක් වසර 20කට වඩා පැරණි වන අතර පෙජරෝ රථය වසර 25කට වඩා වැඩි වේ. පෙර සඳහන් කළ පරිදි කුඩා වැවිලි හිමිකරුවන් සඳහා වන වැඩසටහන් පවත්වනු ලබන්නේ දිවයිනේ විවිධ ප්‍රදේශ වලය. එවැනි දුර බැහැර ප්‍රදේශ වලට ගමන් කිරිම සඳහා පවතින වාහන ඉතාමත් අයෝග්‍ය වේ. සේවායෝජකයන්ට වඩාත් ඵලදයි සේවාවක් සැපයීම සඳහා මෙම වාහන වෙනුවට නව වාහන ප්‍රතිස්ථාපනය කළ යුතු වේ.

තව දුරටත් දුර බැහැර ප්‍රදේශ වල වැඩසටහන් පැවැත්විමේ දි ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ නිසියාකාරව ඇසුරුම් කර ප්‍රවාහනය නොකරන්නේ නම් එම උපකරණ වලට හානි සිදු වේ. නමුත් පවතින වාහන ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ආරක්ෂිතව ප්‍රවාහනය සඳහා යෝග්‍ය නොවන බැවින් ජංගම පුහුණු ඒකකයක් ලෙස කටයුතු කිරිම සඳහා ආයතනය විසින් සුදුසු වාහන මිල දී ගැනිම අවශ්‍ය වේ.

## අනාගත සැලසුම්

වසර 2020 වන විට උපාධි පිරිනැමීමේ ආයතනයක් ලෙස ස්ථාපනය කිරීමේ අරමුණින් NVQ 7 වන මට්ටම දක්වා ආයතනික පාඨමාලාවන් සංවර්ධනය කිරීම සඳහා ආයතනය පියවර ගෙන ඇත.යටිතල පහසුකම් හා පාඨමාලා සංවර්ධනය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් රු.මිලි 314 ක මුදලක් අනුමත කර ඇත. ඉහත සඳහන් කරුණට සමගාමීව පුදුගලයන් 200 ක් දක්වා නේවාසිකාගාර පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා රු.මිලි 223 ක නව සංවර්ධන යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් එය නිර්දේශ කර ඇත.

උපාධි පිරිනැමීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා 2017 වසරේදී රු.මිලි 10.00 ක මුදලක් වෙන් කර ඇති අතර, 2018 වසරේදී මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය සඳහා සැලකිය යුතු අරමුදලක් අපේක්ෂා කරනු ලැබේ.

## සමාප්තිය

2004 වසර අග සිදු වූ ප්‍රතිව්‍යුහකරණ ක්‍රියාවලිය හේතුවෙන් ආයතනය විවිධ බාධාවන් හා අවහිරතා පැවතියද 2015 වසරට සාපේක්ෂව සමාලොචිත වර්ෂයේ මූල්‍යමය වශයෙන් ප්‍රගතියක් ලබා ඇත. රබර් හා තේ භෝගයන්ගේ මිල පහත බැසීම හේතුකොට ගෙන 2016 වසරේ ආයතනික හා කුඩා වතු අංශයේ පුහුණු වැඩ සටහන් සංඛ්‍යාව කෙරේ අහිතකර ලෙස බලපා ඇත. ඒනමුත් ආයතනයේ කාර්යය මණ්ඩලය ශක්තිමත් කරිම මගින් ඉදිරි වර්ෂයන් හීදී කුඩා වතු හිමියන් සඳහා වැඩි වැඩසටහන් ප්‍රමානයක් සිදුකිරිමේ හැකියාවක් පවති.

2016 වසරේ ආදායම හා වියදම අතර රු.මිලි 14.757 ක අතිරික්තයක් දැකිය හැකි අතර ආයතනයේ ශුද්ධ වත්කම් රු.මිලි 126.56 සිට රු.මිලි 203.88 දක්වා වර්ධනය වී ඇත.

තවදුරටත් වැවිලි ක්ෂේත්‍රයේ කුසලතා සංවර්ධනය කිරීමට අත්‍යවශ්‍යම අංගයක් වන NVQ පිළිගැනීම ලබා ගැනීම සඳහා විෂයමාලා සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට ආයතනයට හැකි විය. මහා භාණ්ඩාගාරය විසින් ලබා දුන් මුදල් වලින් රු.මිලි 7.18 ක් වැය කරමින් කුඩා වතු හිමියන් සඳහා වැඩසටහන් 160 ක් පැවැත්වීමට ආයතනයට හැකියාව ලැබී ඇත. ඉදිරි වසර තුලදීත් කුඩා වතු හිමියන් හා වතු කම් කරුවන් සඳහා වන වැඩසටහන් සඳහා වැඩි අවධානයක් යොමු කරනු ලැබේ. මෙම තොරතුරු මත පදනම්ව ආයතනය සමාලෝචන වර්ෂයේ දි ලබා ඇති භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත් විය හැකි අතර 2017 වසර සඳහා සැලසුම් කළ සංවර්ධනය ළඟා කර ගැනීමට ආයතනයේ සේවක කැපවීම උනන්දුව සහ අමාත්‍යාංශයේ මෙන්ම පාලක මණ්ඩලයේ උපදේශණ හා මග පෙන්වීම මත සිදු කිරිමට බලාපොරොත්තු වේ.

2016 වසරේ අරමුණු ක්‍රියාකාරකම් හා ප්‍රතිලාභයන් ලඟා කර දිම සඳහා දායක වූ සියලුම දෙනාට ආයතනයේ සභාපති, පාලක මණ්ඩලය හා කළමණාකාරීත්වයේ ස්තුතිය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නෙමු.



**දීප්ති අශෝක අබේවික්‍රම**

**සභාපති**

**ජාතික වැවිලි කළමනාකරණ ආයතනය**

**31/07/2017**

2016

# මූල්‍ය වාර්තා

# පටුන

| මූල්‍ය වාර්තා | පිටුව |
|---|---|
| 2016 මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් | 01 - 10 |
| මූල්‍ය තත්ව ප්‍රකාශනය | 11 - 12 |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය | 13 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 14 - 15 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 16 |
| අයවැය සහ සත්‍ය කාර්ය සාධනය | 17 |
| 2016 වර්ෂය සඳහා ගිණුම් සටහන් | 18 - 36 |
| විගණකාධිපති වාර්තාව | 37 - 44 |

# ජාතික වැවිලි කළමනාකරණ ආයතනය
# 2016 මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්

## 01. වාර්තාකරණ අස්ථිත්වය

1979 අංක 45 දරණ ජාතික වැවිලි කළමනාකරණ පනත යටතේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස සංස්ථාපනය කරන ලද මෙම ආයතනය 1981 අංක 76, 1987 අංක 05 සහ 2003 අංක 38 සංශෝධනයන් මගින් වඩාත් වැඩදායී රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස සවිබල ගන්වා ඇත.

මෙම පනත් වලට අනුව ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යාපන හා පුහුණු වැඩ සටහන් සාර්ථකව නිම කරන ප්‍රධාන ක්ෂේත්‍ර තුනේ නියුතු විධායකයින් වෙත වෘත්තීය සාමාජිකත්වය ලබා දීමට බලයලත් එකම ආයතනය ජාතික වැවිලි කළමනාකරණ ආයතනය වේ. මෙම ආයතනය කුඩා වතු ක්ෂේත්‍රය ඇතුලත් වැවිලි ක්ෂේත්‍රයේ සේවයේ නියුතු වූවන්ගේ වෘත්තීයමය නිපුණතාවය උසස් මට්ටමෙන් පවත්වා ගෙන යාම කෙරෙහි සැලකිලිමත් වන අතර, මෙම පරමාර්ථ ලගා කර ගැනීම සඳහා ආයතනය විවිධ වැඩමුළු, වැඩ සටහන්, දේශණ, විභාග හා පර්යේෂණ හා උපදේශාත්මක සේවා, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනයන් වෙත ලබා දිම සිදු කරනු ලැබේ. එමෙන්ම විදේශීය සිසුන් සඳහා පුහුණු වැඩ සටහන් පැවැත්වීමේ හැකියාව ද අයතනය සතුව පවති.

ලියාපදිංචි කාර්යාලය එම්. ඩී. එච්. ජයවර්ධන මාවත, අතුරුගිරිය යන ස්ථානයේ පිහිටා ඇත.

## 2.0 පිළියෙල කිරීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

**ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමය විසින් ප්‍රකාශිත ගිණුම්** කරන **ප්‍රමිතින්ට අනුව උපචිත පදනම මත මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත. මෙම මූල්‍ය වාර්තාවෙහි මූල්‍ය තත්ව ප්‍රකාශය, කාර්යය සාධන වාර්තාව, ශුද්ධ වත්කම් පිළිබඳ වාර්තාව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ අයවැය හා සත්‍ය කාර්යය සාධන වාර්තාව සමග වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති** හා සටහන් **ඇතුලත් කර ඇත.**

### 2.2 ඇගයීමේ පදනම

මූල්‍යය ප්‍රකාශන පහත සඳහන් අයිතම හැරුණු විට ඓතිහාසික පිරිවැය පදනමට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

- ප්‍රත්‍යාගණන පදනම මත වාහන අගයන් පෙන්නුම් කර ඇත.

- 2014 වර්ෂයේදී යන්ත්‍ර සූත්‍ර හා උපකරණ පිරිවැය ගණනය කර ඇති අතර 2014 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පළමු වරට අනුගත වීම ලෙස අනාවරණය කර ඇත. පසු කාලීනව වාර්ෂික වාර්තාකරණ කාලය සඳහා පිරිවැය ආකෘතිය බල පැවැත්වේ. 2014.12.31 දින බගවන්තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ දේපල නැවත ප්‍රත්‍යාගණනය කරන ලද අතර, 2015 දී මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කර ඇත.

## 03. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

අවිච්ඡින්න පැවැත්මේ සංකල්පය මත මූල්‍ය අවශ්‍යතා ප්‍රකාශන අතර මෙම අවස්ථා කාල සීමාව පුරාවට ආදාල වේ. රාජ්‍ය ප්‍රදාන මගින් හා පුහුණු වැඩ සටහන්, අධ්‍යාපන වැඩසටහන්, උපදේශන සේවා බාර ගැනීම, වාර්ශික සමාජික දායක මුදල් හා ප්‍රකාශන අලෙවිය තුලින් උපයන ආදායම් මගින් අරමුදල් සම්පාදනය කර ගනු ලැබේ. මෙමගින් රැස්කරන අරමුදල් ආයතනයේ අවශතාවය පරිදී වගකීම් පියවීම සඳහා උපයෝගී කර ගනු ලැබේ.

## 3.1 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කර ගනු ලබන අස්පෘශ්‍ය වත්කම් පිරිවැයට සමුච්චිත ක්‍රමක්ෂය හා අපහරණය අඩුකර වාර්තාකරනු ලැබේ. ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිතකාලය සැලකිල්ලට ගෙන සරල මාර්ග ක්‍රමය උපයොගි කරගෙන අස්පෘශ්‍ය වතකම් ක්‍රමක්ෂය කරනු ලැබේ. ඇස්තමේන්තුගත ජීවිත කාලය වාර්ෂිකව වාර්තාකරන කාල සීමාවන් හී විමර්ෂණයට භාජනය කරන අතර එහි කිසියම් වෙනසක් වේනම් පිරික්සුම් අගය පදනම්ව ගිණුම් ගත කරනු ලැබේ.

- **පරිගණක මෘදුකාංග**

  ආයතනය විසින් සංවර්ධනය කරනු ලැබූ ගිණුම්කරණ මෘදුකාංගය වැටුප් ගෙවුම් මෘදුකාංග, පුහුණු දත්තයන් සහ සම්පත් කළමනාකරණ මෘදුකාංගයන් අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගෙන ඇත. මේවා පරිගණකයෙහි මෙහෙයුම් පද්ධතියක් කොටසක් ලෙස ගත නොසලකන අතර මෙම වත්කම් වසර 4 ක් පුරා ගිණුම් පොත් වලින් ලියා හැරීමට කටයුතු කර ඇත.

- **දුරස්ථ අධ්‍යාපන විෂය මාලා සංවර්ධනය**

  දුරස්ථ අධ්‍යාපන විෂය මාලා සංවර්ධනය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගෙන ඇති අතර, සංවර්ධිත විෂයමාලා සඳහා ප්‍රයෝජනවත් පීවිත කාලය වසර 4 ක් ලෙස සැලකිල්ලට ගෙන ඇත.

- **ජාතික වෘත්තීය නිපුණතා මට්ටම දක්වා විෂය මාලා සංවර්ධනය කිරීමට වැය වන පිරිවැය**

  ආයතනය විසින් එහි පාඨමාලා ජාතික වෘත්තීය නිපුණතා සහතිකය ලබා ගැනීමට හැකි පරිදි සංවර්ධනය කරන අතර සංවර්ධිත පිරිවැය අස්පෘශ්‍ය වත්කම් ලෙස සැලකිල්ලට ගනු ලැබේ. එම පිරිවැය වසර 4 කින් ගිණුම් වලින් ලියා හැරීමට කටයුතු කරනු ලැබේ.

  අස්පෘශ්‍ය වත්කම් සඳහා ප්‍රයෝජනවත් ජීව කාලය පහත සඳහන් පරිදි ඇස්තමේන්තු ගත කර ඇත.

| විස්තරය | පරිගණක මෘදුකාංග | දුරස්ථ අධ්‍යාපන පාඨමාලා සංවර්ධන පිරිවැය | NVQ පාඨමාලා සංවර්ධන පිරිවැය |
|---|---|---|---|
| **ප්‍රයෝජනවත් ජීව කාලය** | වසර 04 | වසර 04 | වසර 04 |

## 3.2 කුඩා වතු හිමියන් සහ පාසැල් හැර ගිය සිසුන් සඳහා ධාරිතා වර්ධන වැඩ සටහන්

කුඩා වතු හිමියන් සඳහා පවත්වන ධාරිතා සංවර්ධන වැඩ සටහන් ආයතනයේ ප්‍රාග්ධන සංවර්ධන පිරිවැයක් ලෙස සලකනු ලැබේ. ඒ මගින් ඔහුන්ගේ දැනුම වර්ධනය වීමට හේතු පාදක වී ඇති අතර, කුඩා වතු හිමියන්ගේ ධාරිතාවන් වර්ධනය වී ඇත. අවසාන පාරිභෝගිකයාගේ දෑතට ගුණත්වයෙන් ඉහල නිෂ්පාදනයන් ලබා දීමේ පෙරදැරිව කුඩා වතු හිමියන්ගේ කෘෂිකාර්මික දැනුම අපේක්ෂිත මට්ටමට සංවර්ධනය සඳහා කඩිනම් අවශ්‍යතාවයක් සේ සලකා මෙම වැඩ සටහන් සංවිධානය කරනු ලැබේ. මෙම වැඩ සටහන් වලට අමතරව වැවිලි ක්ෂේත්‍රයට පිවිසීමට බලාපොරොත්තු වන පසැල් හැර ගියවුවන් සඳහා NVQ සහතිකය ලබා ගැනීමට හැකි පරිදි ඔවුන්ගේ කුසලතා වැඩි කිරිම වෙනුවෙන්ද ආයතනය විසින් පාඨමාලා සංවිධානය කරනු ලබයි.

මෙම වැඩ සටහන් මගින් ආයතනයේ කීර්තිනාමය වර්ධනය කරන අතර, කුඩා වතු හිමියන්ගේ කළමනාකරණ දැනුම වර්ධනය කිරීම හා ඔවුන්ගේ ආදායම් වැඩි වීම කෙරෙහි බලපානු ලැබේ. මෙම වැඩසටහන්හි ප්‍රතිඵල වර්ෂය තුළදී උපලබ්ධි වන බවට උපකල්පනය කරන අතර, එම නිසා ආයෝජිත අගය එම වර්ෂයේදීම ලියා හරිනු ලැබේ. 2016 වසරේ ජාතික අයවැය මගින් රුː මිලියන 8.446 ක් මුදලක් වැය කර කුඩා වතු හිමියන්ගේ සහ කම්කරුවන්ගේ දැනුම වර්ධනය කිරීමේ වැඩ සටහන් 160 ක් පවත්වා ඇති අතර පාසැල් හැර ගිය සිසුන් සඳහා හඳු පාඨමාලා 02 ක සංවිධානය කර තිබුණි.

## 3.3 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ඓතිහාසික පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කර පෙන්නුම් කර ඇත. වත්කම ක්‍රියාකාරී තත්වයට පත් කරන තුරු වූ සෑම ඍජු පිරිවැයක්ම මෙන්ම සැලකිය යුතු මට්ටමේ අළුත්වැඩියාවන් මෙම ඓතිහාසික පිරිවැයෙහි අන්තර්ගත කර ඇත.

දේපල පිරියත හා උපකරණයන්ගේ එක් එක් අයිතමයන් ප්‍රයොජනවත් ජීවිත කාලයෙහි වෙනස් කම් මත ඒවා වෙන් වශයෙන් ජීවිත කාලය අනුව ක්ෂය ගණනය කර ඇත.

### 3.3.1 ප්‍රයෝජනවත් ජීව කාලය

සරල මාර්ග ක්‍රමය පදනම්ව ක්ෂය ගණනය කරනු ලබන අතර, ගිණුම් සඳහා ක්ෂය ඇස්තමේන්තුගත කරනු ලබන්නේ වත්කමේ ජීවිත කාලය සැලකිල්ලට ගෙන පිරිවැයෙන් සුන්බුන් අගය අඩු කිරීම මඟිනි.

පොදුවේ උපයෝගී කර ගනු ලැබූ ක්ෂය අනුපාතයන් පහත පරිදිවේ.

ප්‍රවර්ථන හා පෙර වරෂ සඳහා ආදාල ඇස්තමේන්තුගත ප්‍රයොජනවත් ජීවිත කාලය සහ උපයොගිකරගත් ක්ෂය අනුපාතයන් පහත සඳහන් වේ.

| නිදහස් ගොඩනැගිලි | අවු. 20 | 5% |
|---|---|---|
| **කාර්යාලීය ලී බඩු** | අවු. 10 | 10% |
| **මෝටර් වාහන** | අවු. 5 | 20% |
| **මාර්ග පද්ධති, ජල සැපයුම්, විදුලිය හා දුරකථන, (යටිතල වත්කම්)** | අවු. 10 | 10% |
| **පුස්තකාල පොත්** | අවු. 10 | 10% |
| **ඉඩම් වැඩි දියුණු කිරීම්** | අවු. 10 | 10% |

පහත ජේදයේ සඳහන් ව්‍යාතිරේඛයන් හැර අනෙකුත් අනුපාතයන් පොදුවේ අදාල වේ.

<u>ව්‍යාතිරේඛයන්</u>

- උපකරණ තුළ යන්ත්‍ර සූත්‍ර, කාර්යාලීය උපකරණ සහ නේවාසිකාගාර උපකරණ ආදී භාණ්ඩ ඇතුලත් වේ. පහත සඳහන් පරිදි මේවායේ ජීව කාලය එකිනෙකට වෙනස් වේ.
  යන්ත්‍ර සූත්‍ර වසර 5
  කාර්යාලීය උපකරණ වසර 5
  නේවාසිකාගාර උපකරණ වසර 4

- පරිගණක ජාල කරණය, යටිතල පහසුකම් ලෙස වර්ගීකරණය කර පැවතියද ප්‍රයෝජනවත් ආයු කාලය අවුරුදු 5 ක් ලෙස සලකනු ලැබේ.
- 150 KVA ජෙනරේටරය යන්ත්‍රෝපකරණ යටතේ වර්ගීකරණය කර ඇති අතර එහි ප්‍රයෝජනවත් ආයු කාලය වසර 10 ක් ලෙස සලකනු ලැබේ.

රාජ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ වත්කම් සඳහා පහත සඳහන් දෑ ඇතුලත් කර ඇත.

- මාර්ග සංවර්ධන වියදම්
- ජල සැපයීමේ වියදම්
- විදුලි සැපයීමේ වියදම්
- පරිගණක ජාලකරණය

ක්ෂය කිරිමේ ක්‍රමය ප්‍රයොජනවත් ජීවිත කාලය සහ අවශේෂ වටිනාකම සෑම මූල්‍ය වර්ෂකදීම විමර්ෂණයට භාජනය කර නියමිත ගැලපිලි අවශ්‍ය වූ විට සිදුකරනු ලැබේ.

## මිනුම්කරණ පදනම

ඉඩම් හා වාහන හැර අනෙකුත් සියළුම වත්කම් පිරිවැය පදනම සැලකිල්ලට ගෙන ක්ෂය කිරීම සිදුවෙන අතර වාහන ප්‍රත්‍යාගනන පදනම සැලකිල්ලට ගෙන ක්ෂය කිරීම සිදු කරනු ලැබේ. ඉඩම් සඳහා ක්ෂය කිරීම සිදු කරනු නොලැබේ.

### 3.3.2 අපහරණය කිරීම

දේපල පිරියත උපකරණයන් හී අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොමැති විට හෝ අපහරණයෙන් භවිතයෙන් ඉවත් කල විට රැගෙන එන වටිනාකම නැවත හඳුනාගැනීමකට භාජනය කරනු ලැබේ. පාඩුව හෝ ලාභය ලැබෙන මිල හා රැගෙන එන වටිනාකම සසඳා තිරණය කරනු ලැබේ. මේම අගයන් කාර්යය සාධන වාර්තාවේ අන්තර් ගත කරනු ලැබේ.

### 3.3.3 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

ආයතනය වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය පවත්වා ආර්ථිකමය වශයෙන් භාවිතයට ගත නොහැකි ද්‍රව්‍ය අපහරණය කිරීම සඳහා නිර්දේශ කරනු ලබයි.

### 3.3.4 ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් අත්පත් කර ගත් ඉඩම් වල වර්තමාන තත්වය

හෙක්ටයාර 1.9499 ක භූමි ප්‍රමාණයක් සහ කාර්ය මණ්ඩල නිල නිවාස 03 ක් ශ්‍රී ලංකා යුධ හමුදාවේ 7 වෙනි රෙජිමේන්තුව විසින් අත්පත් කරගෙන ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 (අ)

වගන්තිය යටතේ ඉහත සඳහන් දේපල වල හිමිකාරීත්වය අත්පත් කර ගන්නා ලදී. ආයතනයට ලැබිය යුතු රුः මිලියන 55.0 ක වන්දි මුදල ආපසු ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කරමින් පවතී.

## 4.0 යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් ඇති තැම්පතු

යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් සේවා සපයන ආයතනයන් ඉදිරිපත් කර ඇති සුරක්ෂිත තැම්පතු මෙයට ඇතුලත්වේ.

## 5.0 තොගයන්

ආයතනයේ ප්‍රකාශන, මුද්‍රණ උපකරණ, ලිපි ද්‍රව්‍ය, කාර්යාල අවශ්‍යතා, ටයර්, ගොඩනැගිලි නඩත්තු උපකරණ සහ වෙනත් පාරිභෝග පරිහරණ ද්‍රව්‍යයන් තොගයේ අන්තර්ගත වේ. තොග ගණනයන් ප්‍රථම නිකුතු ක්‍රමය සැලකිල්ලට ගෙන ගණනය කරනු ලැබේ. තේ සංවර්ධන ව්‍යාපෘතියෙන් ප්‍රදානය කල පොත් වල වටිනාකම ප්‍රකාශන තොගයේ ඇතුලත් කර ඇත.

තොගයේ පිරිවැය - ගත්මිල, ගැලපුම් පිරිවැය, අනෙකුත් පිරිවැය

තොගයන්හි රැගෙන එන වටිනාකම පහත සඳහන් කර ඇත.

| අයිතමය | රැගෙන එන වටිනාකම ධාරණ අගය රුः 000 | විකුණුම් පිරිවැය | රැගෙන එන ධාරණ අගය රුः 000 |
|---|---|---|---|
| **ලිපිද්‍රව්‍ය** | 175.9 | - | 175.9 |
| **මුද්‍රණ උපකරණ** | 343.1 | - | 343.1 |
| **සුභ සාධන අයිතම** | 10.3 | - | 10.3 |
| **පාරිභෝගික අයිතම** | 24.7 | - | 24.7 |
| **ගොඩනැගිලි නඩත්තු උපකරණ** | 100.6 | - | 100.6 |
| **ටයර් සහ ටියුබ්** | 30.8 | - | 30.8 |
| **ප්‍රකාශන** | 425.0 | - | 425.0 |
| **එකතුව** | 1110.6 | - | 1110.6 |

### ප්‍රදානය කල ප්‍රකාශනයන්

ප්‍රකාශන පොත් ප්‍රමාණයේ වටිනාකම ප්‍රකාශන තොගයේ ඇතුලත් කර ඇති අතර, විලම්බිත ආදායම් යටතේ ජංගම වගකීම් වල පෙන්නුම් කර ඇත. ආදයම ආදාල වර්ෂය තුලදී උපලබ්ධි වන ආකාරය අනුව ගිණුම් ගත කරනු ලැබේ.

## 6.0 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑ සඳහා මුදල් සහ අතුරුගිරිය ලංකා බැංකු ශාඛාවේ ජංගම ගිණුමේ ශේෂයන් ඇතුලත්ය.

## 7.0 මූල්‍ය උපකරණ

ණය හා ලැබිය යුතු දෑ හා තැන්පතු ගණුදෙනුව ඇති වූ අවස්ථාවේදීම ආයතනය මුලික වශයෙන් මුල්‍ය උපකරණයක් ලෙස හදුනාගන්නා අතර එම මුල්‍ය වත්කම් මුදල් කරන දිනයේදී  මුල්‍ය ප්‍රවාහය තුලට ඇතුලත් කරනු ලැබේ.

### කල් පිරෙන තෙක් තබා ගන්නා මූල්‍ය වත්කම්

කල් පිරෙන තෙක් තබා ගැනිමේ අරමුණින් මුලිකව හදුනා ගන්නා ලද සුරකුම් පත් කල් තබා ගනනා මුල්‍ය වත්කම් ලෙස වර්ගිකරණය කරනු ලැබේ.  මෙම මුල්‍ය වත්කම්  මුලික හදුනා ගැනිමේදී  ධාරණ අගයට සෘජුව බලපාන ගණුදෙනු පිරිවැය එකතුකර අපහායණයන් අඩුකර සඵල පොලි අනුපාත ක්‍රමයට ගණනය කරනු ලබයි.
මෙම මුල්‍ය වත්කම කල් පිරිමට පෙරාතුව විකිනිම සිදුකරනු ලැබිමකදි විකිනිමට ඇති අයෝජන ලෙස වාරතාකරණය කරනු ලැබේ.

### ණය සහ ලැබිය යුතු දෑ.

ණය සහ ලැබීය යුතු දෑ සක්‍රීය වෙළඳපොල මිල තිරණය සඳහා ඉදිරිපත් නොවන අතර එම වත්කම් මුලිකව ධාරණ අගයට සෘජුව සම්බන්ධ ගණුදෙනු පිරිවැය එකතු කර අගය කරනු ලැබේ. පසුව එම ණය හා ලැබිය යුතු දෑ ක්‍රමක්ෂය පිරිවැය මත සඵල පොලි  අනුපාතයට අනුව ගණනය කර අපහායනය අඩුකර පෙන්නුම් කරනු ලැබේ.

## 8.0 සේවක විශ්‍රාමික ප්‍රතිලාභ

ආයතනයේ සේවයේ නියුතු වුවන් විශ්‍රාම යාමේදි ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂිතය සඳහා වෙන් කිරිමක් සිදු කර එය විශ්‍රාමික ප්‍රතිලාභ යටතේ පෙන්නුම් කර ඇත. ඉදිරි වර්ෂය තුලදි උපචිත ගෙවීම් ජංගම වගකිම් ඇතුලත පෙන්නුම් කරන අතර විශ්‍රාමික පාරිතෝෂිතයට සමාන අගයන් ලංකා බැංකුවේ ස්ථාවර තැන්මත් ගිණුමක ආනගත වගකිම් පියවිම සඳහා අයෝජනය කර ඇත.

විශ්‍රාමික දායක සැලසුම සඳහා ආයතන සේවක අර්ථ සාදක අරමුදල හා සේවක භාරකාර අරමුදල ඇතුලත් වේ.

මෙම විශ්‍රාමික දායක සැලසුම සඳහා ආයතනයේ සියළුම සේවකයින් සඳහා සමාන දායක මුදලක් ගණනය කරනු ලබන අතර ඒ සඳහා මූලික වැටුප් හා ජීවන වියදම් දීමනා ඇතුලත් කර ගනි.

## 9.0 විලම්භිත ආදායම

### ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන

ප්‍රාග්ධන සංවර්ධන වියදම් සඳහා සැලකිය යුතු මුදලක් ජාතික අය වැය දෙපාර්තමේන්තුව මඟින් ප්‍රදානය කරන අතර මෙම මුදල විලම්භිත ආදායම් ගිණුමේ ඇතුලත් කර ඇත. වත්කම්හී ප්‍රයෝජනවත් ජීවිත කාලය සැලකිල්ලට ගෙන වර්ෂයේ ක්ෂය වන මුදල හා සමාන මුදලක් ආදායම් වාර්තාවට වාර්ෂිකව ක්‍රමානුකූලව උපලබ්ධි කරිම LKAS 20 අනුකූලව 2015.12.31 දින දක්වා සිදු කර ඇත.

මෙම ආදයම් ගිණුම්ගත කිරිම සඳහා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හදුන්වා දි ඇති අතර එය 2017 වසර තුල බලපවත්වනු ලැබේ. කලින් අනුගත විම ධෛර්‍යමත් කිරිම මත ප්‍රමිතියට අනුකූලව ප්‍රාග්ධන ප්‍රදානයන් කාර්යය සාධන වාර්තාවේ ආදායමක් ලෙස 2016 වසරේදි පෙන්නුම් ඇත.

## 10.0 කෙටි කාලීන වෙන් කිරිම් සහ අසම්භාව්‍යන්

### 10.1 අසම්භාව්‍ය වගකීම්

ශ්‍රව්‍ය දෘෂ්‍ය නිළධාරි ලෙස ආයතනයේ සේවය කල ඒ. සී. කේ. අත්තනගොඩ මහතා විසින් විනය කරුණු හේතු කොට ගෙන ඔහුව සේවයෙන් පහ කිරිම පිළිබඳව නීතිමය පියවර ගෙන ඇත. මෙම හේතුවෙන් 2015/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 708,378/- ක්වූ අසම්භාව්‍ය වගකීමක් ඔහුගේ වැටුප්, වේතන හා අනෙකුත් ගෙවීම් වෙනුවෙන් වෙන් කර ඇත. මේ වන විට මෙම නඩුව කම්කරු උසාවියේ විමර්ෂණය වෙමින් පවතී. 2015/12/31 දිනට වෙන් කර ඇති අසම්භාව්‍ය බැරකම රු. 3,765,756/-කි.

ඇති විය හැකි අනාගත වගකිම් හෝ වර්තමාන වගකිම් පිළිබදව මුදල් ගලා යාමේ ප්‍රවාහයන් හදුනාගැනීමේ අපහසු හේතුවෙන් 2016 වසර සඳහා ආයතනය කිසිදු වෙන් කිරිමක් සිදු කර නොමැත.

### 10.2 අඩමාන ණය සඳහා වෙන් කිරීම

වර්ෂය අවසාන ණයගැති ශේෂය සඳහා 6% ක අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කර ඇත.

## 11.0 ආදායම් හඳුනාගැනිම

**පුහුණු ආදායම**

### 11.1 කෙටි කාලීන වැඩ සටහන්

පුහුණු කාල සීමාව මාස 06 කට වඩා අඩු නම් එම වැඩ සටහන කෙටි කාලීන වැඩ සටහනක් ලෙස සලකනු ලැබේ. පුහුණු වැඩ සටහන ආරම්භක වර්ෂයේදීම මෙහි මුළු ආදායම හා වියදම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කරනු ලැබේ.

### 11.2 දිගු කාලීන පුහුණු වැඩ සටහන් (ඉදිරියට යන පුහුණු වැඩ සටහන්)

පුහුණු කාල සීමාව මාස 06 ට වඩා වැඩි වන්නේ නම් එම වැඩ සටහන් දිගු කාලීන වැඩ සටහන් (ඉදිරියට යන වැඩ සටහන්) ලෙස සලකනු ලැබේ. මෙහි පුහුණු වැඩ සටහන් වල ආරම්භක මාසය හා පාඨමාලා කාල සීමාව සැලකිල්ලට ගෙන සමානුපාතික පදනම උපයෝගී කර ගෙන ආදායම් හා වියදම් කාලීන පදනම මත ගිණුම් ගත කෙරේ.

### 11.3 බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානය

බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් සහ වියදම වෙන වෙනම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පෙන්නුම් කර ඇත. 2016 වර්ෂයේ ශුද්ධ අතිරික්තය රුඃ 2,369,572.54/- ක් ලෙස වාර්තා වී ඇත.

### 11.4 වෙනත් ආයතන වෙත පහසුකම් කුලියට ලබා දීම.

ආයතනය ආදායම් ඉපයීම සඳහා එහි පහසුකම් වෙනත් ආයතන වෙත කුලී පදනමින් ලබා දෙනු ලැබේ. ආයතනයේ ප්‍රමුඛ පරමාර්ථයට පරිභාහිරව වෙනත් ව්‍යපෘතියක් හේතුවෙන් මෙහි ආදායම් හා වියදම් වෙන වෙනම මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ වාර්තා කරනු ලැබේ.

### 11.5 රජයේ ප්‍රදාන

ජාතික අයවැය දෙපාර්තමේන්තුව වාර්ෂික අයවැය මගින් සැලකිය යුතු මුදලක් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් වෙනුවෙන් ප්‍රදානය කරන අතර, එය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 11 ට අනුව ගිණුම් ගත කර ඇත.

## 12.0 වාර්තාකරණ දිනට පසු සිදුවන සිදු වීම

මූල්‍ය වාර්තා නිකුත් කිරිමට අනුමත කරන දිනය හා වාර්තා කරන අවසාන දිනය අතරතුර සිදුවන හිතකර හා අහිතකර සිදුවීම් වාර්තාකරන දිනයට පසු සිදුවීම් ලෙස ගනු ලැබේ. සිදුවන සිදුවීමේ වටිනාකමේ ස්වභාවය මත මෙම සිදුවීම් හෙළිදරව් කල යුතු හෝ ගැලපිය යුතු කරුණු ලෙස අවශ්‍ය ආකාරයට මූල්‍ය වාර්තා වල වාර්තා කරනු ලැබේ.

**ගැලපීය යුතු අවස්තා**

මූල්‍ය තත්වය ප්‍රකාශනයේ ගැලපිය යුතු සිදුවීමක් සිදු නොවූ හේතුවෙන් ගැලපිලි සටහනක අවශ්‍යතාවයක් පැන නොනැගිනි.

**හෙළිදරව් කල යුතු අවස්තා**

**ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් අත්පත් කර ගන්නා ලද ඉඩමේ තත්වය**

ශ්‍රී ලංකා යුධ හමුදාවේ 7වන ඉංජිනේරු ස්වෙච්චා රෙජිමේතුව මගින් ඉඩම් හෙක්ටයාර 1.9499 ක් හා කාර්ය මණ්ඩල නිල නිවාස 03 ක් ශ්‍රී පවරා ගැනිමට ලක් කර ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් දේපල වල අයිතිය ඔවුන් වෙත ලබාදි ඇත. මේ වෙනුවෙන් රුː මිලියන 55.0 මුදලක් ආයතනයට ලැබිමට ඇත. ආයතනය විසින් නැවත මෙම දේපල ලබා ගැනීම සඳහා ඉල්ලිමක් කර ඇත. ආයතනය 2020 දී උපාධි ප්‍රදානය කරන ආයතනයක් ලෙස සංවර්ධනය කිරීමට කටයුතු යොදා ඇති අතර මේ සඳහා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව නිර්දේශ ලබා දි ඇති අතර එහි ඇස්තමේන්තුගත වටිනාකම රුː මිලියන 314.0 ක් වේ. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර 2017 දී ආරම්භ කිරීමට නියමිතය.

## 13.0 නිකුත් කරන ලද නමුත් මෙතෙක් බලනොපවත්නා ප්‍රමිත.

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) 11 සිට 20 දක්වා නිකුත් කර ඇති අතර, ඒවා බලාත්මක විමේ දිනය 2016 ජුනි මස 30 වන දින හෝ ඊට පසුව යෙදි ඇති අතර කලින් අනුගත විම සඳහා අවසර දි ඇත. ඒ අනුව ගිණුම්කරණ ප්‍රමිත 11 සඳහන් රජයේ ප්‍රදානයන් ගිණුම් ගත කිරිම 2016 වසරේ සිට අනුගත විම සිදුකර ඇත.

**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය**

**මූල්‍ය තත්ව ප්‍රකාශනය රු. 000**

2016 දෙසැම්බර් 31 දිනට

| **වත්කම්** | **සටහන්** | **2016** | **2015** |
|---|---|---|---|
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 14 | 9,429,122.50 | 13,162,263.14 |
| ලැබිය යුතු දෑ | 15 | 6,406,142.67 | 7,105,336.93 |
| තොගයන් | 16 | 1,110,640.27 | 1,486,914.96 |
| කලින් ගෙවීම් | 17 | 2,174,165.11 | 350,140.40 |
| වෙනත් ජංගම වත්කම් | 18 | 16,136,788.77 | 19,486,768.12 |
| | | **35,256,859.32** | **41,591,423.55** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ලැබිය යුතු දෑ | 19 | 1,308,730.19 | 1,534,485.18 |
| දේපල, පිරියත හා උපකරණ | 20 | 190,082,148.84 | 176,755,723.14 |
| අස්පෘශ්‍ය වත්කම් | 21 | 1,590,188.79 | 1,250,381.79 |
| ජංගම නොවන වෙනත් වත්කම් | 22 | 611,975.00 | 611,975.00 |
| | | **193,593,042.82** | **180,152,565.11** |
| | | | |
| **මුළු වත්කම්** | | **228,849,902.14** | **221,743,988.66** |
| | | | |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු දෑ | 23 | 13,511,832.17 | 18,925,639.12 |
| කෙටි කාලීන ප්‍රතිපාදන | 24 | 3,765,756.60 | 3,765,756.60 |
| සේවක ප්‍රතිලාභ | 25 | - | 850,287.00 |
| | | **17,277,588.77** | **23,541,682.72** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්භිත රාජ්‍ය ප්‍රදාන | 26 | - | 62,560,661.33 |
| සේවක ප්‍රතිලාභ | 27 | 7,581,312.24 | 8,959,642.00 |
| ආපසු ගෙවන ආරක්ෂිත තැන්පතු | 28 | 110,649.71 | 119,923.60 |
| | | **7,691,961.95** | **71,640,226.93** |
| **මුළු වගකීම්** | | **24,969,550.72** | **95,181,909.65** |
| | | | |
| **ශුද්ධ වත්කම්** | | **203,880,351.42** | **126,562,079.01** |
| | | | |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| **රජය දායක වූ ප්‍රාග්ධනය හා වෙනත් රාජ්‍ය අස්ථිත්වයන්ගේ දායකත්වය** | 29 | 38,386,495.21 | 38,386,495.21 |
| **සංචිතයන්** | 30 | 113,728,054.19 | 113,728,054.19 |
| **සමුච්චිත අතිරික්තය / (ඌණතාවය)** | 31 | 51,765,802.02 | (25,552,470.39) |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | **203,880,351.42** | **126,562,079.01** |
| | | | |

පිටු අංක 1 -10 දක්වා සහ 13 සිට 35 සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සංඝටනීය කොටසක් වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කර ඇති බවට සහතික වෙමි.

**එල්. ඩී. ජේ. ප්‍රියන්ත**
**ගණකාධිකාරී**

**මෙම ගිණුම් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටින අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.**

**ආචාර්ය ප්‍රසාද් ධර්මසේන**
**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී**
2017.06.19

**දිප්ති අශෝක අබේවික්‍රම**
**සභාපති**

**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය**

**මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය**

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| **ආදායම** | සටහන් | 2016<br>රු: | 2015<br>රු: |
|---|---|---|---|
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | 32 | 38,961,000.00 | 28,502,000.00 |
| විලම්බිත රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ආදායම | 33 | 32,689,000.00 | 23,072,107.53 |
| පුහුණු ආදායම් | 34 | 12,787,802.17 | 18,009,514.48 |
| නේවාසික පහසුකම් කුලියට දීම තුලින් ලද ආදායම් | 35 | 9,397,569.33 | 8,210,182.12 |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් | 36 | 4,835,304.57 | 5,365,812.44 |
| පොලී ආදායම් | 37 | 992,211.13 | 939,416.94 |
| වෙනත් ආදායම් | 38 | 2,165,320.96 | 697,104.23 |
| **මුළු ආදායම** | | **101,828,298.16** | **84,796,137.74** |
| | | | |
| **වියදම්** | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 39 | 31,834,558.90 | 30,907,243.90 |
| සැපයුම් සහ පාරිභෝගික ද්‍රව්‍ය භාවිතය | 40 | 3,008,488.36 | 3,022,117.39 |
| නඩත්තු සහ අළුත්වැඩියා | 41 | 4,032,431.91 | 4,062,089.64 |
| සන්නිවේදන සහ උපයෝගිතා සේවා | 42 | 8,547,744.86 | 7,097,806.41 |
| පුහුණු වියදම් ධාරිතා පුහුණු වැඩසටහන් ද ඇතුළුව | 43 | 14,326,920.45 | 15,918,425.76 |
| නේවාසික පහසුකම් කුලියට දීම සඳහා වූ වියදම් | 44 | 2,561,429.35 | 1,819,174.91 |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වියදම් | 45 | 2,465,732.03 | 2,872,680.37 |
| ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් | 46 | 18,951,476.64 | 17,740,102.78 |
| වෙනත් වියදම් | 47 | 1,341,904.58 | 724,058.56 |
| **මුළු වියදම්** | | **87,070,687.08** | **84,163,699.72** |
| කාල සීමාවට අදාල අතිරික්තය / (ඌනතාවය) | | 14,757,611.08 | 632,438.02 |
| **පාලන අස්තිවෙයේ හිමිකාරීත්වයට අදාල කොටස** | | **14,757,611.08** | **632,438.02** |

ජාතික වැවිලි කළමනාකරණ ආයතනය

## ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

*2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂ සඳහා*

**ශුද්ධ වත්කම් / ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය රු 000❑**

| විස්තරය | දායක වූ ප්‍රාග්ධන | ප්‍රත්‍යාගණන සංචිතය | රදවා ගත් සමුච්චිත අතිරික්ත/ (ඌණතාවය) | මුළු ශුද්ධ වත්කම් /ස්කන්ධය |
|---|---|---|---|---|
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | **38,386,495.21** | **10,584,233.03** | **(24,351,329.70)** | **24,619,398.54** |
| 2014 ප්‍රත්‍යාගණන ලාභය | - | 99,539,399.11 | - | 99,539,399.11 |
| 2014 වසර සඳහා අතිරික්තය / (හිඟය) | - | - | (1,833,578.71) | (1,833,578.71) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **38,386,495.21** | **110,123,632.14** | **(26,184,908.41)** | **122,325,218.94** |
| | | | | |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රත්‍යාගණන ලාභය | | 3,604,422.05 | | 3,604,422.05 |
| 2015 වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය | - | - | 632,438.02 | 632,438.02 |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 38,386,495.21 | 113,728,054.19 | (25,552,470.39) | 126,562,079.01 |
| | - | - | | |
| **2015.12.31 දිනට විලම්බිත ආදායම් ගිණුමේ ශේෂය රඳවාගත් ලාභ ගිණුමට මාරු කිරීම.** | | | **62,560,661.33** | **62,560,661.33** |
| **2016 වසර සඳහා අතිරික්තය** | | | **14,757,611.08** | **14,757,611.08** |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **38,386,495.21** | **113,728,054.19** | **51,765,802.02** | **203,880,351.42** |

රාජ්‍ය අංශයේ ගණුම්කරණ ප්‍රමිතීන් අංක 11 අනුව, රජයේ ප්‍රතිපාදනය පිළිගනු ලබන්නේ ආයතනයේ ආදායම් වශයෙනි. 2016 වසර සඳහා ප්‍රාග්ධන ප්‍රදාන රුඃ 32,689,000/- ක් ලැබි ඇති අතර එය 2016 වසරේ ආදායමක් ලෙස කාර්යය සාදන වාර්තාවේ පෙන්නුම් කර ඇත.

2015.12.31 දිනට පැවති විලම්බිත අදායමේ ගිණුමේ ශේෂය රඳවාගත් ලාබ ගිණුමට මාරු කර ඇත. ඒ අනුව 2016.12.31 දිනට ශුද්ධ වත්කම් ශේෂය රු. 203,880,351.42 දක්වා වැඩි වි ඇත.

**ජාතික වැවිලි කළමනාකරණ ආයතනය**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

*2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා*

| ***මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් සිදු වූ මුදල් ප්‍රවාහයන්*** | 31/12/2016 | නැවත ප්‍රකාශිත 31/12/2015 |
|---|---|---|
| | රු: | රු: |
| වර්ෂය සඳහා අතිරික්තය (හිඟය) | 14,757,611.08 | 632,438.02 |
| අඩු කලා පොලී ආදායම | 1,444,824.09 | 939,416.94 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය | 13,312,786.99 | (306,978.92) |
| *මුදල් නොවන සංචලනයන්* | | |
| ක්ෂය | 18,512,040.64 | 17,344,477.78 |
| ක්‍රමක්ෂය | 439,436.00 | 395,625.00 |
| විශ්‍රාමික පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් | (2,228,616.76) | 2,599,464.37 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභ / අලාභ | 78,522.92 | - |
| විලම්බිත ආදායම් | (32,689,000.00) | (23,072,107.53) |
| අඩමාණ ණය වෙන් කිරීම වැඩි වීම | 200,399.00 | 50,848.00 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම්) / අඩුවීම් | 602,036.66 | (2,517,649.10) |
| තොගයන්හි (වැඩිවීම්) / අඩුවීම් | 376,274.69 | (551,558.71) |
| කලින් ගෙවුම් හි (වැඩිවීම්) / අඩුවීම් | (1,824,024.71) | 179,586.87 |
| අනෙකුත් ජංගම වත්කම් හි (වැඩිවීම්) / අඩුවීම් | 4,381,936.15 | (4,931,726.03) |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හි වැඩිවීම් / (අඩුවීම්) | (5,413,806.95) | 4,387,654.00 |
| කෙටි කාලීන වෙන් කිරීම් වැඩිවීම් / (අඩුවීම්) | - | 708,378.00 |
| මූල්‍යමය උපකරණ වල ක්‍රමක්ෂය | 452,612.96 | |
| සේවක රක්ෂිත තැන්පතු වැඩිවීම් / (අඩුවීම්) | (9,273.89) | 17,127.70 |
| *මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය* | **(3,808,676.30)** | **(5,696,858.57)** |
| *ආයෝජන ක්‍රියාකාරකම්* | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | (32,050,477.26) | (9,332,646.08) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම | (779,243.00) | (625,246.79) |
| | 133,488.00 | |
| කෙටි කාලින දේපල පිරියත හා උපකරණ තැන්පතු වල ආයෝජනය කිරීම | (866,270.60) | (3,056,664.98) |
| තැන්පතු මුදල් බවට පත් කිරීම | | 5,000,000.00 |
| ණය අත්තිකාරම් ගෙවීම | (1,976,280.00) | (2,341,150.00) |
| ණය හා අත්තිකාරම් ලැබීම් | 1,982,199.64 | 1,444,411.81 |
| පොලී ආදායම් ලැබීම් | 943,118.88 | 664,563.91 |
| *ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය* | **(32,613,464.34)** | **(8,246,732.13)** |
| *මූල්‍ය ක්‍රියාකාරකම්* | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානයන් | 32,689,000.00 | 18,200,000.00 |
| *මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් වූ ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය* | **32,689,000.00** | **18,200,000.00** |
| | | |
| *මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම් / (අඩුවීම්)* | **(3,733,140.64)** | **4,256,409.30** |
| | | |
| *මුදල් හා මුදල් සමාන දෑ හී වර්ෂ ආරම්භක ශේෂය* | **13,162,263.14** | **8,905,853.84** |
| | | |
| *මුදල් හා මුදල් සමාන දෑ හී වර්ෂ අවසාන ශේෂය සටහන් 14* | **9,429,122.50** | **13,162,263.14** |

**ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය**

**අයවැය සහ සත්‍ය කාර්ය සාධනය**

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. 000

| *ආදායම* | | *සත්‍ය* | *අයවැය* | *ප්‍රගතිය* |
|---|---|---|---|---|
| රජයේ පුනරාවර්තන ප්‍රදාන | 32 | 38,961 | 40,000 | 97% |
| විලම්බිත රජයේ ප්‍රාග්ධන ප්‍රදානයන්ගෙන් ආදායම | 33 | 32,689 | 34,000 | 96% |
| පුහුණු ආදායම් | 34 | 12,788 | 24,112 | 53% |
| නේවාසික පහසුකම් කුලියට දීම | 35 | 9,398 | 8,400 | 112% |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් | 36 | 4,835 | 7,000 | 69% |
| පොලී ආදායම් | 37 | 992 | 1,100 | 90% |
| වෙනත් ආදායම් | 38 | 2,165 | 1,588 | 136% |
| ***මුළු ආදායම්*** | | **101,828** | **116,200** | **88%** |
| | | | | |
| ***පුනරාවර්තන වියදම්*** | | | | |
| වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ | 39 | 31,835 | 38,376 | 83% |
| සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය භාවිතයන් | 40 | 3,008 | 5,104 | 59% |
| නඩත්තු සහ අලුත්වැඩියා | 41 | 4,032 | 3,670 | 110% |
| සන්නිවේදන සහ උපයෝගීතා සේවා | 42 | 8,548 | 8,890 | 96% |
| පුහුණු වියදම් | 43 | 14,327 | 17,300 | 83% |
| පහසුකම් කුලියට දීම සම්බන්ධ වියදම් | 44 | 2,561 | 2,350 | 109% |
| බගවන්තලාව පුහුණු මධ්‍යස්ථානයේ වියදම් | 45 | 2,466 | 2,750 | 90% |
| ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම් | 46 | 18,951 | 16,000 | 118% |
| වෙනත් වියදම් | 47 | 1,342 | 1,760 | 76% |
| **මුළු වියදම්** | | **87,071** | **96,200** | **91%** |
| | | | | |
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| දේපල පිරියත හා උපකරණ | | 32,050 | 34,000 | 94% |
| අස්පෘශ්‍ය වත්කම් | | 779 | 2,000 | 39% |
| ධාරිතා වර්ධන වැඩ සටහන් හා NVQ වැඩ සටහන් | | 8,447 | 10,000 | 84% |
| **මුළු ප්‍රාග්ධන වියදම්** | | **41,276** | **46,000** | **90%** |
| | | | | |
| **මුළු වියදම්** | | **128,347** | **142,200** | **90%** |
| භාණ්ඩාගාර ප්‍රදාන | | | | |
| පුනරාවර්තන වියදම් | | 38,961 | 40,000 | 97% |
| ප්‍රාග්ධන වියදම් | | 32,689 | 34,000 | 96% |
| **මුළු ප්‍රදාන** | | **71,650** | **74,000** | **97%** |

| | | 2016 | 2015 |
|---|---|---|---|
| 14 | මුදල් හා මුදල් සමාන දෑ | | |
| | | | |
| | ලංකා බැංකුව අතුරුගිරිය ශාඛාව - 3697566 | 2,714,122.50 | 6,447,263.14 |
| | ලංකා බැංකුව අතුරුගිරිය ශාඛාව - 8693502 | 1,715,000.00 | 1,715,000.00 |
| | ලංකා බැංකුව අතුරුගිරිය ශාඛාව - 74689528 | 5,000,000.00 | 5,000,000.00 |
| | | **9,429,122.50** | **13,162,263.14** |

| | | | |
|---|---|---|---|
| 15 | ලැබිය යුතු දෑ (කෙටි කාලීන) | | |

| | | | |
|---|---|---|---|
| 15 (අ) | වෙළඳ ණයගැතියෝ | | |
| | කැලණිවැලි වැවිලි සමාගම | 7,500.00 | 7,500.00 |
| | ඇල්කඩුව වැවිලි සමාගම | 75,000.00 | 75,000.00 |
| | වැවිලි නිවාස සංවර්ධන අරමුදල | 164,901.40 | 164,901.40 |
| | වයඹ විශ්ව විද්‍යාලය | 2,075.00 | 2,075.0 |
| | ඇල්පිටිය වැවිලි සමාගම | - | 122,500.00 |
| | කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව | - | 17,500.00 |
| | තුරුසවිය අරමුදල | 18,070.00 | - |
| | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 1,851,688.31 | 2,643,941.25 |
| | ජාතික කඩදාසි සංස්ථාව | - | 23,174.66 |
| | තේ මණ්ඩලය | 20,800.00 | 52,577.50 |
| | කොටගල වැවිලි සමාගම | - | 15,000.00 |
| | පොල් පර්යේෂණ ආයතනය | - | 5,000.00 |
| | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | - | 20,679.26 |
| | කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන | 1,765,000.00 | - |
| | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 5,661.00 | 19,142.59 |
| | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 14,787.25 | 138,011.00 |
| | මධ්‍යම පරිසර අධිකාරිය | - | 11,289.01 |
| | තේ පර්යේෂණ ආයතනය | 181,220.00 | - |
| | පාඨමාලා ගාස්තු | 738,110.69 | 481,818.82 |
| | ඩී. එස්. ඒ. කුමාර | 1,215.00 | - |
| | ශ්‍රී ලංකා තිරසාර බලශක්ති අධිකාරිය | 145,600.00 | - |
| | රබර් සංවර්ධන අධිකාරිය | - | 1,645,160.00 |
| | කාන්තා ක්‍රියාකාරී සංවිධානය | 57,078.18 | - |
| | මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 240,000.00 | 200,000.00 |
| | ටී. ටී. ආර්. එම්. රාජ් මහතා | 5,752.00 | - |
| | එච්. එම්. රත්නසිංහ මහතා | 5,875.00 | - |
| | කේ. එම්. හේමසිරි මහතා | 10,650.00 | - |
| | මොරටුව විශ්ව විද්‍යාලය | - | 267,750.00 |
| | **මුළු ණයගැතියන්** | **5,310,983.83** | **5,913,020.49** |
| | අඩු කලා - අඩමාණ ණය වෙන් කිරීම | 318,659.00 | 118,260.00 |

| | | | |
|---|---|---|---|
| | **ශුද්ධ මුළු ණයගැතියන්** | **4,992,324.83** | **5,794,760.49** |

| | | | |
|---|---|---|---|
| 15(ආ) | **සේවක අත්තිකාරම් සහ ණය** | | |
| | ආපදා ණය | 1,388,367.84 | 1,292,876.44 |
| | උත්සව ණය | 21,450.00 | 13,700.00 |
| | විශේෂ අත්තිකාරම් | 4,000.00 | 4,000.00 |
| | **මුළු සේවක අත්තිකාරම් සහ ණය** | **1,413,817.84** | **1,310,576.44** |
| | **මුළු කෙටි කාලීන ලැබිය යුතු දෑ** | **6,406,142.67** | **7,105,336.93** |
| | | | |
| | වර්ෂයේ ආරම්භක ශේෂය | 2,845,061.62 | 1,948,323.43 |
| | සේවකයින්ට ගෙවීම් | 1,976,280.00 | 2,341,150.00 |
| | සේවකයින්ගෙන් අය කර ගැනීම් | (1,982,199.64) | (1,444,411.81) |
| | **වසර අවසානයේදී ඉතිරිය** | **2,839,141.98** | **2,845,061.62** |
| | කෙටි කාලීන ණය සහ අත්තිකාරම් | 1,413,817.84 | 1,310,576.44 |
| | දිගු කාලීන ණය සහ අත්තිකාරම් | 1,425,324.14 | 1,534,485.18 |

| | | | |
|---|---|---|---|
| 16 | **තොගයන්** | | |
| | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 175,902.65 | 301,810.15 |
| | මුද්‍රණ උපකරණ | 343,131.50 | 440,427.72 |
| | නඩත්තු උපකරණ | 100,622.00 | 308,443.00 |
| | ටයර් සහ ටියුබ් | 30,893.00 | 30,893.00 |
| | සුභ සාධන උපකරණ | 10,314.00 | 16,975.00 |
| | පාරිභෝජන ද්‍රව්‍ය | 24,724.00 | 15,697.58 |
| | ආයතන ප්‍රකාශනයන් | 425,053.12 | 369,104.96 |
| | වියලි ආහාර ද්‍රව්‍ය | - | 3,563.55 |
| | **මුළු තොගයන්** | **1,110,640.27** | **1,486,914.96** |

| | | | |
|---|---|---|---|
| 17 | **කලින් ගෙවීම්** | | |
| | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (වාර්ෂික බලපත්‍ර) | 32,737.58 | 25,088.92 |
| | මෙට්‍රොපොලිටන් ඔෆිස් පුද්ගලික ආයතනය | 1,131.28 | - |
| | ඔෆිස් නෙට්වර්ක් පුද්ගලික ආයතනය | 7,532.50 | - |
| | IDAC පුද්ගලික ආයතනය | 4,889.29 | - |
| | පී. වයි. සමන්ත | 5,819.18 | - |
| | ගෙස්ටෙට්නර් සිලෝන් පුද්ගලික ආයතනය | 3,468.83 | - |
| | සී. බී. ඒ. පුද්ගලික ආයතනය - සේවා ගිවිසුම | 1,811.52 | - |
| | සයන්ස් ලැන්ඩ් ඉන්ෆොමේෂන් සිස්ටම් | 4,744.11 | - |
| | ලියක්තා ඔෆිස් නෙට්වර්ක් සිස්ටම් | 1,772.19 | - |
| | ශ්‍රී ලංකා රක්ෂණ සමාගම | 332,666.93 | 119,161.88 |
| | ජාතික රක්ෂණ අරමුදල | - | 107,922.18 |
| | ජෝන් කීල්ස් - සේවා ගිවිසුම | 4,799.32 | 4,153.51 |
| | ආදායම් බදු දෙපාර්තමේන්තුව අතිරික්ත බදු | 1,691,816.38 | 93,813.91 |
| | එච්. සී. ජේ. පෙරේරා මහතා - ඉන්ධන | 80,976.00 | - |

| | | | |
|---|---|---|---|
| | **මුළු කලින් ගෙවීම්** | **2,174,165.11** | **350,140.40** |

| | |
|---|---|
| 18 | **වෙන්ත ජංගම වත්කම්** |

| | | | |
|---|---|---|---|
| 18 (අ) | **කෙටි කාලීන තැම්පතු** | | |
| | ස්ථාවර තැම්පතු - ලංකා බැංකුව අතුරුගිරිය පාරිතෝෂිත වෙන් කිරීම | 11,322,072.39 | 10,555,679.27 |
| | සාමාජික තැම්පතු ගිණුම -ස්ථාවර තැම්පතු ගිණුම් අංක 74175590 | 1,011,236.58 | 940,765.60 |
| | සාමාජික තැම්පතු ගිණුම - ඉතිරි කිරීමේ ගිණුම් | 194,175.12 | 164,768.62 |
| | අයවිය යුතු පොලී ගිණුම - - ලංකා බැංකුව අතුරුගිරිය | 2,275,217.33 | 1,773,512.12 |
| | **මුළු කෙටි කාලීන තැම්පතු** | **14,802,701.42** | **13,434,725.61** |
| | **ක්‍රමක්ෂය පිරිවැය** | **(369,019.01)** | **-** |
| | **මුලු කෙටිකාලින ආයෝජන** | **14,466,682.41** | **13,434,725.61** |

| | | | |
|---|---|---|---|
| 18 (ආ) | **ආරක්ෂිත තැම්පතු** | | |
| | එන්.ඩී.එස්.බී. තෙන්නකෝන් මහතා ගිණුම් අංක 1 - 0053-03-1521-4 | 13,187.15 | 12,621.20 |
| | පී.එන්. පෙරේරා මහතා ගිණුම් අංක 1 - 0053-03-0542-1 | 31,035.19 | 29,702.92 |
| | සී.එස්. ලියනගේ මිය ගිණුම් අංක 1 - 0053-03-0314-3 | 3,697.08 | 3,538.55 |
| | ජී. රාජපක්ෂ මිය ගිණුම් අංක 1 - 0053-03-0319-4 | 3,347.97 | 3,204.36 |
| | ඩබ්.ඩී.එස්. හෙට්ටිආරච්චි මිය ගිණුම් අංක 1 - 0053-03-0617-7 | 2,738.81 | 2,621.34 |
| | එල්.ඩී.ජේ. ප්‍රියන්ත මහතා ගිණුම් අංක - 8634723 | 56,643.51 | 48,539.46 |
| | නිශාමිණී ඉලංගන්තිලක මිය ගිණුම් අංක - 74046706 | - | 19,705.77 |
| | වෛද්‍ය ආධාර තැම්පතු ගිණුම් ජාතික ඉතිරි කිරීමේ බැංකුව අතුරුගිරිය | 1,559,456.65 | 1,392,868.91 |
| | **මුළු ආරක්ෂිත තැම්පතු** | **1,670,106.36** | **1,512,792.51** |
| 18 (ඇ) | **අර්ධ නිමි භාණ්ඩ නොනිමි උපකරණ** | | |
| | 150 Kva ජෙනරේටරය සඳහා වැය වූ මුදල හේලිස් ඉලෙක්ට්‍රිකල්ස් ස්වලූෂන් පුද්ගලික සමාගම | - | 4,539,250.00 |
| | | **-** | **4,539,250.00** |

| | | | |
|---|---|---|---|
| | **මුළු වෙනත් ජංගම වත්කම්** | **16,136,788.77** | **19,486,768.12** |

| | |
|---|---|
| 19 | **ලැබිය යුතු දෑ - දීර්ඝ කාලීන** |

| | | | |
|---|---|---|---|
| | ආපදා ණය (වර්ෂයකට වඩා වැඩි) | 1,425,324.14 | 1,534,485.18 |
| | ක්‍රමක්ෂය පිරිවැය | (116,593.95) | - |
| | මුළු දිගු කාලීන ලැබීම් | 1,308,730.19 | 1,534,485.18 |
| 20 | **දේපල පිරියත සහ උපකරණ** | **190,082,148.84** | **176,755,723.14** |
| | | | |

## ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය

### දේපල පිරියත හා උපකරණ ලේඛනය රු.

| විස්තරය | ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම් | ගොඩනැගිලි | උපකරණ | ලී බඩු | වාහන | යටිතල පහසුකම් වත්කම් | පුස්තකාල පොත් | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | | | |
| 2015/01/01 දිනට | **1,726,876.68** | **150,093,440.95** | **11,612,158.43** | **8,061,691.00** | **26,044,302.19** | **14,855,447.28** | **2,247,148.40** | | **214,641,064.93** |
| එකතු කිරීම් | - | 3,790,709.24 | 3,715,520.99 | 1,623,669.25 | - | 202,746.60 | - | | **9,332,646.08** |
| මාරු කිරීම් | - | - | - | - | - | | - | | **-** |
| ප්‍රත්‍යාගණනය | - | 686,225.34 | - | - | - | | - | | **686,225.34** |
| 2015/12/31 දිනට | **1,726,876.68** | **154,570,375.53** | **15,327,679.42** | **9,685,360.25** | **26,044,302.19** | **15,058,193.88** | **2,247,148.40** | | **224,659,936.35** |
| එකතු කිරීම් | - | 10,382,641.98 | 7,487,903.82 | 1,838,754.50 | 8,900,000.00 | 3,238,573.36 | 202,603.60 | | 32,050,477.26 |
| ඉවත් කිරීම්-ලීබඩු | - | | (198,228.29) | (194,682.86) | | | | | (392,911.15) |
| ඉවත් කිරීම්-නේවාසිකාගාර අයිතම | - | | (409,504.00) | | | | | | (409,504.00) |
| මාරු කිරීම් | - | | (6,930.00) | 6,930.00 | | | | | - |
| 2016/12/31 දිනට | **1,726,876.68** | **164,953,017.51** | **22,200,920.95** | **11,336,361.89** | **34,944,302.19** | **18,296,767.24** | **2,449,752.00** | | **255,907,998.46** |
| **ක්ෂය වීම්** | | | | | | | | | |
| **සමුච්චිත ක්ෂය** 2015/01/01 දිනට | **-** | **11,622,733.54** | **2,607,039.89** | **1,048,226.00** | **13,957,626.12** | **2,583,314.68** | **1,658,991.91** | | **33,477,932.14** |
| ක්ෂය පිරිවැය | - | 7,401,125.02 | 2,436,595.45 | 796,120.70 | 5,208,860.43 | 1,422.131.33 | 79,644.85 | | **17,344,477.78** |
| ඉවත් කිරීම් | | | | | | | | | |
| ප්‍රත්‍යාගණන ගැලපීම් | | (2,918,196.71) | | | | | | | **(2,918,196.71)** |
| මාරු කිරීම් | | | | | | | | | |
| **සමුච්චිත ක්ෂය** 2015/12/31 දිනට | **-** | **16,105,661.85** | **5,043,635.34** | **1,844,346.70** | **19,166,486.55** | **4,005,446.01** | **1,738,636.76** | | **47,904,213.21** |
| ක්ෂය පිරිවැය | - | 7,544,608.18 | 3,240,192.18 | 953,245.10 | 5,218,040.04 | 1,493,039.49 | 79,957.88 | | 18,529,082.87 |
| ඉවත් කිරීම්-ලීබඩු | - | | (122,493.26) | (58,406.97) | | | | | (180,900.23) |
| ඉවත් කිරීම් -නේවාසිකාගාර අයිතම | | | (409,504.00) | | | | | | (409,504.00) |
| ප්‍රත්‍යාගණන ගැලපීම් | | | (539.21) | 539.21 | (17,042.23) | | | | (17,042.23) |
| **සමුච්චිත ක්ෂය** 2016/12/31 දිනට | **-** | **23,650,270.03** | **7,751,291.05** | **2,739,724.04** | **24,367,484.36** | **5,498,485.50** | **1,818,594.64** | | **65,825,849.62** |
| 2015/12/31 දිනට ශුද්ධ පොත් අගය | **1,726,876.68** | **138,464,713.68** | **10,284,044.08** | **7,841,013.55** | **6,877,815.64** | **11,052,747.87** | **508,511.64** | | **176,755,723.14** |
| 2016/12/31 දිනට ශුද්ධ පොත් අගය | **1,726,876.68** | **141,302,747.48** | **14,449,629.90** | **8,596,637.85** | **34,944,302.19** | **12,798,281.74** | **631,157.36** | | **190,082,148.84** |

**ප්‍රත්‍යාගණනය**

ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෝටර් රථ වාහන වසර 3 සිට 5 දක්වා කාලය තුළ ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණය සඳහා මුල් වරට අනුගත විමේදි 2014 වසරේදී අතුරුගිරිය ප්‍රධාන පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම්, යටිතල පහසුකම් හා පුස්තකාල පොත් හැර අනෙකුත් දේපල උපකරණ ප්‍රත්‍යාගණනය කරන ලදී. බගවන්තලාව ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථානයේ දේපල හා උපකරණ 2014.12.31 වැනි දිනට නැවත ප්‍රත්‍යාගණනය කරන ලදී.

**(අ) මෝටර් වාහන**

